# වාර්ෂික වාර්තාව 2009



ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# වාර්ෂික වාර්තාව
# 2009

සැකසුම

**සැලසුම් අංශය**

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

### ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

# ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ
# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන 2009 වාර්ෂික වාර්තාවට සුභ පැතුම් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන සතුටු වෙමි.

අප රටේ වටිනාම සම්පත වන ළමා පරපුර ආරක්ෂා කරගැනීම අප සියළු දෙනා වෙත පැවරී ඇති භාරදූර වගකීමකි. ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය රජය වෙනුවෙන් එම වගකීම දරන ප්‍රධාන රාජ්‍ය ආයතනයයි. අප අමාත්‍යාංශයට මෙන්ම විෂය භාර අමාත්‍යවරයා ලෙස මටද පැවරී ඇති එම වගකීම ඉටු කිරීමේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඉටු කරනු ලබන සේවාව ඉතා අගය කළ යුතුය. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, ළමා අපයෝජන පිටු දැකීම හා ළමයින්ගේ ආරක්ෂාව සැලසීම යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිය සේවා සපයනු ලබන්නේ ක්‍රමවත්වූ වැඩ පිළිවෙළකට අනුවය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වසරින් වසර නවතාවයක් ලබා දෙමින් ක්‍රියාත්මක කරන වැඩසටහන් පිළිබඳ වාර්තාවක් සකස් කොට රජයට භාර දීමත් ප්‍රකාශයට පත් කිරීමත් සිදු කරනු ලබන්නේ සිය කාර්ය භාරයේ ඇති වගකීම විශාල බැවිනි.

2009 වසරේ එවකට සිටි විෂය භාර අමාත්‍යවරිය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා අපේ රටේ දරු පරපුර වෙනුවෙන් විශාල සේවයක් ඉටු කර ඇති බව මෙම වාර්තාව අධ්‍යයනය කිරීමේදී මට අවබෝධ විය.

එම කාලය තුළ සිදු කළ සේවාවන් තවදුරටත් ක්‍රියාත්මක කරමින් ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කොට අපයෝජනයන්ගෙන් දරුවන් මුදවා ගැනීමට විවධ වැඩ කොටස් මේ වන විටත් ක්‍රියාත්මක කරමින් සිටින්නෙමු. 1929 ළමා උපකාරක දුරකථන සේවාව පැය විසිහතර පුරාම ක්‍රියාත්මක කිරීම, ළමා සංවර්ධන මධ්‍යස්ථාන සේවාවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම හා විවිධ ආකාරයේ දැනුවත් කිරීම් මගින් ළමයින් අපයෝජනයන්ගෙන් මුදවා ගැනීම හා ඔවුන්ගේ සුරක්ෂිත භාවය තහවුරු කිරීම ආදී කටයුතු ඒ අතර වේ.

අපේ රටේ දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමේ වගකීම පැවරී ඇති ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දරුවන් වෙනුවෙන් නව නවත් සේවා ඉටු කරන්නට අවශ්‍ය ශක්තිය ධෛර්යය නොඅඩුව ලැබේවා! යි ප්‍රාර්ථනා කරමි.

තිස්ස කරල්ලියද්ද (පා.ම.)
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍ය
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

2011.11.11

# ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දශක තුනක කාලයක් පුරා පැවති යුද්ධය දරුවන්ගේ අනාගතයට අහිතකර බලපෑමක් ඇති කළ බව අප දන්නා සත්‍යයකි. මෙම යුධ වාතාවරණය පැවති යුගය තුළ දමිළ දරුවන් ළමා සොල්දාදුවන් ලෙස යොදාගත් ආකාරය ඉතාමත් ඛේදජනකය. එකල කුඩා දරුවන්ට අකුරු කරන්නට අවැසි පොත් පැන් පැන්සල් වෙනුවට සයනයිඩ් ගෙල බැඳ ටී 56 ගිනි අවිය දැතට තුරුළු කර ප්‍රචණ්ඩකාරී යුද්ධයට තම ශ්‍රමය කැප කිරීමට සිදු විය. එම යුගය නිමා කර නිදහස් නිවහල් රටක් අපට ලබා දිම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ අප්‍රතිහත ධෛර්යය මා මෙහිදී සිහිපත් කරන්නේ දැඩි ආඩම්බරයකිනි.

අතිගරු ජනාධිපතිතුමන් ළමයින්ට සුවිශේෂ වූ ස්ථානයක් හිමිකර දීම අප ලැබූ භාග්‍යයකි. ජාති, ආගම්, කුල භේදයකින් තොරව ලක් මවගේ සියළුම දරුවන්ට එක සමානව සැලකීම සම්බන්ධයෙන් මම සතුටු වෙමි.

දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විශාල සේවයක් සිදු කරන බව මා දන්නා සත්‍යයකි. සුරක්ෂිත දරු පරපුරක් දැයට දායාද කිරීමේ භාරධූර වගකීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත. එය ප්‍රබල වගකීමකි. ඒ සඳහා විශාල දායකත්වයක් අධිකාරිය විසින් සිදු කරන බව මා මෙහිදී සඳහන් කරන්නේ සතුටින්ය. සුරක්ෂිත දරු පරපුරක් දැයට දායාද කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ශක්තිය ලැබේවා! යි ප්‍රාර්ථනා කරමි.

එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා (පා.ම.)
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍ය
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

2011.11.15

# ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ පණිවිඩය



නූතන සංකීර්ණ සමාජය තුළ ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පුළුල් කතිකාවක අවශ්‍යතාවය නිර්මාණය වී ඇත. වර්තමාන සමාජයේ පවුල් සංස්ථාවට පැවරී ඇති කාර්යභාරය පුළුල් පරාසයක් තුළ ව්‍යාප්තව පවතියි. අතීත ශ්‍රී ලාංකීය සමාජය තුළ පැවැති විස්තෘත පවුල් ඒකකය තුළ සාමාජිකයන් බොහෝ පිරිසක් ජීවත්වූ බැවින් ළමයාගේ ආරක්ෂාව තහවුරු වී පැවතුණි.  එහෙත් වර්තමාන සමාජයේ දක්නට ලැබෙන අතිශය කාර්යබහුල තත්ත්වය නිසා  ළමයාගේ ආරක්ෂාව බෙහෙවින්  අවදානමට ලක්ව පවතින බව දක්නට ලැබෙයි. මෙම තත්ත්වය හේතු කොටගෙන ජාතික ළමා ආරක්ෂක අධිකාරියට සුවිසල්  කාර්යභාරයක් ඉටු කිරීමට සිදුව ඇත. එය නිරන්තර අධීක්ෂණය, කැපවීම හා දරුවන් කෙරෙහි ස්වභාවයෙන්ම ඇති වන්නා වූ ආදරය හා සැලකිල්ල පදනම්  කොට ගෙන සිදුවිය යුත්තකි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අරමුණ ඉටු කර ගැනීම සඳහා සහාය වූ අමාත්‍යාංශයේ මීට පෙර සිටි ලේකම්වරු ද  මෙම අවස්ථාවේ දී සිහිපත් කරමි.

දැයේ ජීවනාලිය බඳු දරුවන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් කැපවී ක්‍රියා කරන ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සේවය බෙහෙවින් අගය කරන අතර දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන්  ක්‍රියා කිරීමට  අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි.

සුමිත්‍රා රාහුබද්ධ
ලේකම්
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

2011.11.12

# ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වර්තමාන සභාපතිතුමියගේ පණිවිඩය



සියළු අපයෝජනයන්ගෙන් තොර සුරක්ෂිත දරු පරපුරක් දැයට දායාද කිරීමේ භාරධූර කර්තව්‍යය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැවරී ඇත. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් දරුවන්ට සුවිශේෂී ස්ථානයක් හිමිකර දිම වෙනුවෙන් වෙනම ම අමාත්‍යාංශයක් ද පිහිටු වීම ඉතාමත්ම අගය කළයුතු කාලෝචිත ක්‍රියාවකි. "හොඳම දේ දරුවන්ට" සහ මහින්ද චින්තනයේ "මල්වන් දරුවන් " යන සංකල්පයන්ට අනුගතව දැයේ දරුවන් වෙනුවෙන් ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් උරුම කර දීම සඳහා මේ වන විටත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ප්‍රබල කාර්යභාරයන් රැසක්ම ඉටු කර ඇත.

ළමා අපයෝජනය සම්බන්ධයෙන් සමස්ථ ප්‍රජාවම දැනුවත් කිරීම සිදු කළ යුතුය. ඒ සම්බන්ධයෙන් වැඩසටහන් ගණනාවක් මේ වන විටත් ආරම්භ කර ඇත. ළමා අපයෝජනය සම්බන්ධයෙන් පවත්නා නීති සංශෝධනය කිරීමේ කාලීන අවශ්‍යතාවයක් මෙන්ම දැයේ දරුවන්ගේ ආරක්ෂාව සඳහා නව නීති ඇති කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද අපේ අවධානය යොමු කර ඇත.

දරුවන්ගේ හෙට දින සුරක්ෂිත කිරීම උදෙසා අපට නිබඳව ශක්තියක්ව සිටින ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍ය ගරු තිස්ස කරල්ලියද්ද මැතිතුමා හා නියෝජ්‍ය අමාත්‍ය ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මැතිතුමා මේ අවස්ථාවේ දී කෘතවේදීව සිහිපත් කරමි. එමෙන් ම අමාත්‍යාංශයේ ලේකම්තුමිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මූල මණ්ඩලයෙන් ලැබෙන සහාය ද අගය කරමි. ළමයින් සම්බන්ධයෙන් ක්‍රියා කරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන් ද අප වෙත දක්වන දායකත්වය ප්‍රසංශනිය වේ. තවද ළමා අපයෝජන තුරන් කිරීමේ කාර්යයෙහි ලා ජනතාව දැනුවත් කිරීමේ දී මාධ්‍ය ආයතනය විසින් අප වෙත ලබා දුන් සහයෝගය ද මේ අවස්ථාවේ දී සිහිපත් කරමි.

ආශ්චර්යමත් ශ්‍රී ලංකාව තුළ ජිවත් වන සියළුම ළමයින් සුරක්ෂිත කර ගැනිම සමස්ත සමාජය සතුව පවතින ප්‍රබල වගකීමකි. ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ අත්වැල් බැඳ ගන්නා ලෙසට සැමට ආරාධනා කරමි.

අනෝමා දිසානායක

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2011.11.10

# ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නියෝජ්‍ය සභාපතිතුමියගේ පණිවිඩය



රටක අනාගතය තීරණය කරනු ලබන්නේ, වර්තමානයේ ජීවත්වන මනා පෞරුෂයකින් හෙබි දූ දරුවන් විසින්ය. මෙහිදී සුරක්ෂිත දරු පරපුරක් දැයට දායාද කිරීමේ ප්‍රබල වගකීමක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැවරී තිබේ. එම වගකීම ඉටු කිරීම සඳහා අධිකාරිය විසින් දැඩි කැපවීමෙන් ක්‍රියා කරනු ලබයි.

වර්තමාන සමාජයේ ජීවත් වන බොහෝ දරුවන් කායික,මානසික සහ ලිංගික වශයෙන් අපයෝජනය වීම දක්නට ලැබෙයි. මෙය බරපතල සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇත. මෙම තත්ත්වය අවම කිරීම ඉතාමත් ම භාරධූර කර්තව්‍යයකි. ඒ සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට සිදුව ඇත. එය ඉතාමත් දුෂ්කර වුවත් අප අධිකාරිය දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සුවිශාල කාර්යභාරයක් සිදු කර ඇති බව මා ප්‍රකාශ කරන්නේ ඉතාමත් සතුටින්ය.

ළමා අපයෝජනය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සියළුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි සිදු කර ඇත. එමෙන්ම 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත යටතේ අධිකාරිය වෙත පැවරී ඇති වගකීම්ද අප ඉටුකරනු ලබයි. සුනාමි දරුවන්ගේ සුභසාධනය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ශ්‍රී ලංකාවේ සියලු දරුවන්ට අපයෝජනයෙන් තොර සුරක්ෂිත සමාජයක් උරුම කර දීම සඳහා අප සමග එක්වන්නැයි සියලු දෙනාට ම ආරාධනා කරමි.

නන්දා ඉන්ද්‍රවංශ
නියෝජ්‍ය සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2011.11.16

| පටුන | පිටුව |
|---|---|


| | |
|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ හැඳින්වීම | 01 |
| 2009 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය | 02 |
| 2009 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය | 04 |
| 2009 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කළමනාකරණ හා විගණන කමිටුව | 05 |
| 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14 වගන්තියෙන් ප්‍රකාශිත අධිකාරියේ කාර්යභාරය | 07 |
| 2009 වසරේ අධිකාරියේ සංවිධාන ව්‍යුහය | 09 |
| වසර තුළ ක්‍රියාත්මක ජාතික මට්ටමේ වැඩසටහන් | 11 |
| නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය | 17 |
| විශේෂ පොලිස් විමර්ශන ඒකකය | 22 |
| වැඩසටහන් අංශය | 24 |
| මනෝ සමාජයීය අංශය | 28 |
| නීති අංශය | 34 |
| සැලසුම්/තොරතුරු හා මාධ්‍ය අංශය | 37 |
| පරිපාලන අංශය | 40 |
| මූල්‍ය අංශය | 43 |
| වාර්ෂික ගිණුම් | 46 |
| විගණකාධිපති වාර්තාව | 57 |
| ඇමුණුම් | 66 |

# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ හැඳින්වීම

ලෝක යුද්ධ දෙකකින් අනතුරුව ලෝකය සීඝ්‍රයෙන් වෙනස්කම්වලට භාජනය වූ අතර මෙම තත්ත්වය තුළ ළමයින් දැඩි අනාරක්ෂිත තත්ත්වයට ගොදුරු වන්නට විය. මෙම තත්වය පිළිබඳව ලෝක නායකයින්ගේ අවධානය යොමු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ළමයින් සඳහා වෙනම අයිතිවාසිකම් ප්‍රඥප්තියක් සකස් කොට, දරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට එක්සත් ජාතින්ගේ සංවිධානය කටයුතු කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකාව ද ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන් ගේ ප්‍රඥප්තියට 1991 වසරේ දී එකඟතාවය පළකොට අත්සන් තැබීය. ඉන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ ළමා ප්‍රඥප්තියක් සකස් කරන ලද අතර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අදාළ ජාතික මෙහෙයුම් කමිටුවක් ද පිහිටුවන ලදී.

ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් 1996 වසරේ දෙසැම්බර් මස ස්ථාපිත කළ අතර ළමා අපයෝජන පිටුදැකීම සඳහා රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය ඇති බව එම කමිටු වාර්තාවේ නිරීක්ෂණය විය. ඒ අනුව ළමා අපයෝජන හා ළමයින් නොසලකා හැරීම පිටුදැකීම සඳහා 1999 වසරේ ජනවාරි මස ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) පිහිටුවන ලදී. 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් ස්ථාපිත කරන ලද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, 1999 සිට ජනාධිපති ලේකම් කාර්යාලයේ අධීක්ෂණය හා පාලනය යටතේ සිය පරිපාලන කටයුතු සිදු කරනු ලැබූ අතර 2006 වසරේ සිට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් සිටී.

ශ්‍රී ලංකාවේ 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනයෙන් පසුව එම ආපදාවට ගොදුරු වූ ළමයින් ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධි විධාන) පනත සම්මත විය. එම පනත මගින් අධිකාරියට නව බලතල හා කාර්යයන් ප්‍රමාණයක් පවරන ලදී. ඒ මගින් දෙමාපියන් දෙදෙනාම හෝ මව හෝ පියා හෝ භාරකරු හෝ අහිමි වූ ළමයෙකුගේ භාරකාරත්වය සම්බන්ධව ක්‍රියාකිරීම ද අධිකාරිය කාර්යභාරයට එකතු විය.

ගෘහස්ථ හිංසනයෙන් දරුවන් බේරා ගැනීම සඳහා සම්මත කළ 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මගින් ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විෂය පථය පුළුල් වී ඇත. ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ බව අධිකාරියට වාර්තා වූ විට, තෙවන පාර්ශවකරුවකු වශයෙන් ඊට මැදිහත් වීමට මෙම පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට බලය පවරා ඇත.

# 2009 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය



ජගත් වැල්ලවත්ත මහතා

සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සමාජ විද්‍යා අංශය,
කොළඹ විශ්වවිද්‍යාලය.



නන්දා ඉන්ද්‍රවංශ මහත්මිය

නියෝජ්‍ය සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ.



වෛද්‍ය නීල් ප්‍රනාන්දු මහතා

සාමාජික
මානසික රෝග විශේෂඥ,
උපදේශක, ජාතික මානසික සෞඛ්‍ය
විද්‍යායතනය,
අංගොඩ.



වෛද්‍ය ශාන්ති මාලා ද සිල්වා මහත්මිය

සාමාජික
ළමා රෝග විශේෂඥ,
රිජ්වේ ආර්යා ළමා රෝහල.



වෛද්‍ය ආනන්ද සමරසේකර මහතා

සාමාජික
ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි
විෂවේදය හා නීති වෛද්‍ය
ආයතනය



ආචාර්ය බුද්ධි ප්‍රභා ඩී. ඩී. පතිරණ මහත්මිය

සාමාජික
ජ්‍යෙෂ්ඨ මනෝ විද්‍යා කථිකාචාර්ය,
දර්ශනය හා මනෝ විද්‍යා අධ්‍යයන
අංශය - පේරාදෙණිය විශ්ව
විද්‍යාලය



නීතීඥ පාලිත ප්‍රනාන්දු මහතා

සාමාජික
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්,
නීතිපති දෙපාර්තමේන්තුව.



එන්. කේ. ඉලංගකෝන් මහතා

සාමාජික
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
පොලිස් මූලස්ථානය,
කොළඹ.



වෛද්‍ය අශෝක ජයසේන මහතා

සාමාජික
විශේෂඥ වෛද්‍ය,
(උගුර, කන, නාසය පිළිබඳ)
ශ්‍රී ජයවර්ධනපුර රෝහල



ඩබ්. ආර්. වී. ජ්. සමරසිරි මහතා

සාමාජික
අධ්‍යක්ෂ ,
ජාතික අයවැය
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.



ජේ. ඒ. ඩී. චන්ද්‍රසේන මහතා

සාමාජික



ඩී. එම්. එස්. අබයගුණවර්ධන මහතා

නිල සාමාජික
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව



ඩබ්. ජේ. එල්. යූ. විජේවීර මහතා

නිල සාමාජික
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව.

## 2009 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය



කමලනී ද සිල්වා මහත්මිය

සාමාජික
අතිරේක ලේකම්,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ
අමාත්‍යාංශය.



සන්ධ්‍යා විජේබණ්ඩාර මහත්මිය

සාමාජික
අතිරේක ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.



ආර්. එම්. අයි. රත්නායක මහත්මිය

සාමාජික
ජ්‍යෙෂ්ඨ සහාකාර ලේකම්
රාජ්‍ය ආරක්ෂාව, මහජන
ආරක්ෂාව, නීතිය හා සාමය
පිළිබඳ අමාත්‍යාංශය.



සරත් චන්ද්‍රසිරි විතාන

සාමාජික
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය.



යමුනා චිත්‍රාංගනී මහත්මිය

සාමාජික
අතිරේක ලේකම්
සමාජ සේවා සහ සමාජ
සුභසාධන අමාත්‍යාංශය.



දයා පීරිස් මහත්මිය

සාමාජික
අතිරේක ලේකම්
ළමා සංවර්ධන හා කාන්තා
අභිවෘද්ධි අමාත්‍යාංශය.



ඩබ්.ඩී.එන්. වැලිවත්ත මහතා

සාමාජික
වැඩබලන කම්කරු කොමසාරිස්,
කාන්තා හා ළමා කටයුතු අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව.



හේමා ධර්මවර්ධන මහත්මිය

සාමාජික
අතිරේක ලේකම්,
සංචාරක අමාත්‍යාංශය.



ප්‍රියන්ත මායාදුන්න මහතා

සාමාජික
අතිරේක ලේකම්,
තොරතුරු හා ජනමාධ්‍ය
අමාත්‍යාංශය.

## 2009 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කළමනාකරණ හා විගණන කමිටුව



ඩබ්. ආර්. වී. ජ්. ජ්. සමරසිරි මහතා

සභාපති
අධ්‍යක්ෂ ,
ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය .



ඩී. එම්. එස්. අබයගුණවර්ධන මහතා

සාමාජික
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව.



ජේ. ඒ. ඩී. චන්ද්‍රසේන මහතා

සාමාජික



පී.ඒ.එම්. කුමුදුනි මහත්මිය

සාමාජික
විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.



දේශිකා මල්කාන්ති මහත්මිය

කැඳවුම්කරු
ගණකාධිකාරී
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

## දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත් වීම.

## මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම.

## 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14 වන වගන්තියෙන් ප්‍රකාශිත කාර්යභාරය

- ළමා අපචාර වැළැක්වීම සහ එවැනි අපචාර වලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපචාර වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපචාරවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳව සහ ළමා අපචාර වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපචාර වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවල දී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශිය අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
- සියලු ආකාර ළමා අපචාරවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.
- ළමා අපචාර හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ඇතුලුව එවැනි ළමුන් ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුලු කර ගැනීම.
- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා අවශ්‍ය අවස්ථාවල දී උචිත පියවර ගැනීම.
- ළමා අපචාර පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම.
- ළමා අපචාරවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහාය වීම.
- ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වා ගෙන යාම
- අදාළ අමාත්‍යාංශය හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.
- ළමා අපචාර සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධව පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැලසීම සහ අධ්‍යාපනය ලබා දීම.
- ළමා අපචාරවලට ඇති ඉඩප්‍රස්ථා අවම කිරීම පිණිස සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයේ යෙදීම.
- ළමා අපචාර පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.
- සියලු ආකාර ළමා අපචාර අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර්ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම

**ඉහත දැක්වූ අධිකාරියේ කාර්ය භාරය ප්‍රධාන කාණ්ඩ හතක් යටතේ දැක්විය හැකිය.**

- ළමා අයිතිවාසිකම්, ළමයින් අපයෝජනයෙන් වැළැක්වෙන ආකාරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
- අපයෝජනයට පත්වූවන් ආරක්ෂා කිරීම හා පුනරුත්ථාපනය කිරීම.
- ළමයින් අපයෝජනයෙන් වළක්වා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය
- අදාළ වෘත්තිකයන්ට පුහුණුව ලබාදීම.
- නීති සංශෝධන නිර්දේශ කිරීම හා නීතිය ක්‍රියාත්මක කිරීම.
- ළමා අපයෝජනය වළක්වා ගැනීම පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.
- ඉහත කටයුතු සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධනය




ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් පවරා ඇති කාර්ය භාරය ඉටු කිරීම සඳහා සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය මත ප්‍රධාන අංශ කිහිපයක් යටතේ අධිකාරිය ක්‍රියාත්මක වෙයි. එකී අංශ නම්,

1. නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය
   මධ්‍යම ලේඛනාගාරය
2. වැඩසටහන් අංශය
3. මනෝ සමාජයීය අංශය
4. නීති අංශය
5. විශේෂ පොලිස් විමර්ශන ඒකකය
6. සැලසුම්/තොරතුරු හා මාධ්‍ය අංශය
   පුස්තකාලය
7. පරිපාලන අංශය

## 2009 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේස ංවිධාන ව්‍යුහය



**සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය**

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත අනුව සිටිය යුතු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ගණන 13 ක් වන අතර මූල මණ්ඩල සාමාජිකයන් ගණන 10 කි.

2009 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 09 ක් පවත්වා ඇති අතර එහිදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 56 ක් ඉදිරිපත් කර සාකච්ඡා කර ඇත. නියෝජ්‍ය සභාපති නන්දා ඉන්ද්‍රවංශ මහත්මිය විදේශගත වූ බැවින් පෙබරවාරි මස 01 දින සිට අප්‍රේල් මස 22 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ජේ.ඒ.ඩී. චන්ද්‍රසේන මහතා විසින් නියෝජ්‍ය සභාපති ධූරයේ වැඩ බලන ලදි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික නීතිඥ පාලිත ප්‍රනාන්දු මහතා 2009 වසරේ සැප්තැම්බර් මස සිට ධූර කාලයෙන් ඉවත් වූ අතර නීතිඥ ජයන්ත ජයසූරිය මහතා පුරප්පාඩු වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරට ඔක්තෝබර් මාසයේ සිට පත් විය.

**කළමනාකරණ හා විගණන කමිටුව**

2009 වර්ෂයේ තුළ මූල්‍ය අංශයේ කාර්ය භාරය විධිමත් කිරීම සඳහා කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත. එම කමිටු රැස්වීම් වලදී 2009 සංශෝධිත අයවැය ලේඛනය, මූල්‍ය බලතල බෙදා හැරීම්, 2008 විගණන වාර්තාවේ දැක්වූ කරුණු සම්බන්ධයෙන් අධිකාරිය ගෙන ඇති පියවර, අධිකාරියේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය, 2008 අවසාන ගිණුම්, ඇතුළත් පත්‍රිකා සාකච්ඡා කර ඇත.

## වසර තුළ ක්‍රියාත්මක ජාතික මට්ටමේ වැඩසටහන්

වර්තමාන සමාජය තුළ ළමයා අනාරක්ෂිත වීම බහුලව දක්නට ලැබෙන කරුණකි. සමාජය තුළ තරගකාරීත්වය වැඩිවත්ම ළමයා පවුල තුළ, පාසල් තුළ සහ සමාජය තුළ හුදකලා වීම හේතු කොට අපයෝජනයන්ට දරුවා ගොදුරු වීමේ වැඩි ඉඩක් නිර්මාණය කරයි.

ළමයෙකු අපයෝජනයට පත් වීමට පෙර එය වළක්වා ගැනීම කෙරෙහි සමාජය අවධානය යොමු කිරීම සිදු කළ යුතු කාරණයකි. මන්ද යත්, අපයෝජනයට ගොදුරු වන දරුවා මෙන්ම අපයෝජකයාද සමාජය තුළ ම වෙසෙනා පුද්ගලයින් වීමයි. එහෙයින් සමාජයේ වෙසෙනා අනෙකුත් සියළුම පුද්ගලයින්ට වගකීමක් ඇත. එනම්, ළමා අපයෝජනය සමාජයෙන් මුලිනුපුටා දැමීම සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ දැනුමෙන් සන්නද්ධව ළමා ආරක්ෂකයෙකු ලෙස සමාජයට සේවය කිරීමයි.

## 1. ළමා හිංසනයට එරෙහි ජාතික දිනය

ළමා අපයෝජන වැළැක්වීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම ළමා ආරක්ෂාවේ දී ඉතා වැදගත් ක්‍රමෝපායක් වේ. මේ සඳහා උපයෝගී කර ගන්නා එක් ක්‍රමවේදයක් වන්නේ ළමයින්ට සම්බන්ධ සැමරුම් දින ජාතික මට්ටමින් සැමරීමයි. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 වසරේ දී ළමා හිංසනය පිටුදැකීම සඳහා ජාතික දිනයක් ප්‍රකාශයට පත් කිරීමට ගත් තීරණය මෙම වසරේ දී ක්‍රියාත්මක කිරීමට අධිකාරියට හැකි විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 1581/27 හා 2008 දෙසැම්බර් 26 වැනි සිකුරාදා දින දරණ ගැසට් පත්‍රය මගින් ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍ය ගරු සුමේධා ජී. ජයසේන මැතිණිය විසින් සෑම වසරකම ජනවාරි 04 වැනි දින ළමා හිංසනයට එරෙහි ජාතික දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

ළමා කායික දණ්ඩනය හා ළමා කෲරත්වයට එරෙහිව ක්‍රියාත්මක වීම මෙන්ම ශ්‍රී ලාංකීය ළමා පරපුරේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ළමා හිතකාමී පරිසරයක් ගොඩනැගීම අරමුණු කර ගෙන මෙම කාර්යය සිදු කරන ලදි.

2009 වසරේ ළමා හිංසනයට එරෙහි ජාතික දිනය සැමරීම පිණිස 2009.01.14 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍ය ගරු සුමේධා ජී. ජයසේන මැතිණියගේ ප්‍රධානත්වයෙන් ජාතික උත්සවයක් පවත්වන ලදි. මෙහිදී ළමයින් සඳහා අනුපමේය සේවයක් ඉටු කළ පුද්ගලයන් ඇගයීම සඳහා ළමා සුරැකුම් කෘත්‍යාභිමානී සම්මානය ප්‍රදානය කිරීමෙන් උපහාර දක්වන ලදි.

ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂාව ස්ථාපිත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රථම සභාපති ලෙස සහ ළමා රෝග වෛද්‍ය විශේෂඥයෙකු ලෙස කළ සේවාව අගයමින් මහාචාර්ය හරේන්ද්‍ර ද සිල්වා මහතා ද, ළමා ආරක්ෂාව පිළිබඳව විශේෂඥ දැනුමකින් හෙබි ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පිහිටවනු ලැබූ ජනාධිපති කාර්ය සාධක බලකායේ ප්‍රථම සාමාජිකයෙකු වූ වෛද්‍ය හිරන්ති විජේමාන්න මහත්මිය ද, ළමා අපයෝජන සම්බන්ධ අධිකරණ ක්‍රියාවලියේදී පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ ශිරානි තිලකවර්ධන මහත්මිය ද, ළමුන්ගේ සෞන්දර්යය ඔප නංවමින් ඔවුන්ගේ මානසික හැදියාව දියුණු කිරීම සඳහා චිත්‍රය සහ කථාව ළමුන්ට උචිත වන සේ ලාංකීය ආභාෂයකින් හැසිරවීම වෙනුවෙන් සිබිල් වෙත්තසිංහ මහත්මිය ද, ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා වූ නීති පද්ධතිය ශක්තිමත් කිරීමෙහි පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ මහාචාර්ය සාවිත්‍රි

මහත්මියද, ළමුන්ගේ ආරක්ෂාව සඳහා ළමා හිතකාමී පරිසරයකින් යුතු සේවාවන් සැපයීම සහ මවක මෙන් වින්දිත දරුවන් රැක බලා ගැනීම වෙනුවෙන් නීතා ආරියරත්න මහත්මිය ද, නව තාක්ෂණය තුළ මැවෙන රූප සටහන් වඩාත් ළමුන්ට සමීප අත්දැකීමක්සේ භාෂාව හැසිරවීමෙන් සෞන්දර්යවාදී පුහුණුවක් ළමයා තුළ ඇති කිරීම සඳහා කාටූන් මාධ්‍යය ලාංකීය අනන්‍යතාවයකින් භාවිතා කිරීම වෙනුවෙන් අතුල රන්සිරිලාල් මහතා සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකයේ ස්ථානාධිපති ලෙස ළමා ආරක්ෂාව සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ගුණාත්මක සහ වටිනාකමින් යුත් ක්‍රියාත්මකයන් සිදු කිරීම වෙනුවෙන් ඩබ්. ඩී. ටී. කේ. විජේසේන විතාන මහතා යන මහත්ම මහත්මීන් කෘතඥාභිමානී සම්මානයෙන් පිදුම් ලැබීය.

එමෙන්ම ළමා ආරක්ෂාව සඳහා පුරෝගාමී මාධ්‍ය මෙහෙවරක් ඉටු කළ පහත නම් සඳහන් මාධ්‍යවේදීන් හටද උපහාර දැක්වීම සිදු කරන ලදි. තුසිත පිටිගල මහතා සිරස ටී.වී. නාලිකාව වෙනුවෙන් ද, කළිඳු චතුරංග මහතා ශ්‍රී එෆ්. එම්. ගුවන් විදුලි නාලිකාව වෙනුවෙන් ද, රවීන්ද්‍ර කන්නංගර මහතා සිරස එෆ්. එම්. ගුවන් විදුලි නාලිකාව වෙනුවෙන් ද, විනීතා එම්. ගමගේ මහත්මිය ලංකාදීප පුවත්පත වෙනුවෙන් ද හේමන්ති ගුරුගේ මෙනවිය ඩේලි මිරර් පුවත්පත වෙනුවෙන් ද, බුද්ධිකා ඉඹුලාන මහත්මිය දිණමිණ පුවත්පත වෙනුවෙන් ද, නදීරා ගුණතිලක මෙනවිය ඩේලි නිවුස් පුවත්පත වෙනුවෙන් ද, ප්‍රියන්ති ලිලානි මහත්මිය රූපවාහිනී නාලිකාව වෙනුවෙන් ද, දිනූෂා රාජපතිරණ මෙනවිය ස්වර්ණවාහිනී නාලිකාව වෙනුවෙන් ද, නිශාන්ති කාරියප්පෙරුම මහත්මිය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය වෙනුවෙන් ද, ලක්ෂ්මන් මද්දුමගල මහතා ස්වාධීන රූපවාහිනී සේවය වෙනුවෙන් ද, ගයත්‍රි පින්තු මෙනවිය ලක්බිම පුවත්පත වෙනුවෙන් ද සම්මානයෙන් පිදුම් ලැබීය.
අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබූ මෙම උත්සවය සඳහා රු. මිලියන 1.3ක වියදමක් දැරීම සිදු විය.

## 2. යුධමය තත්ත්වය හේතුවෙන් අවතැන් වූ ජනතාවගේ ළමුන් සඳහා ආධාර එකතු කිරීමේ වැඩසටහන

යුධමය තත්ත්වය හේතුවෙන් උතුරේ අවතැන් වූ ජනතාවගේ ළමුන් සඳහා සහන ලබා දීම සඳහා ද්‍රව්‍යමය භාණ්ඩ හා මූල්‍යමය ආධාර එක් රැස් කිරීමේ වැඩසටහනක් "දේදුනු පාලම" නමින් මෙම වසර මුල දී අධිකාරිය විසින් දියත් කරන ලදි.

මේ යටතේ 2009.06.01 දින කැට ව්‍යාපාරයක් කොළඹ කොටුව ආශ්‍රිතව සිදු කරන ලදි. මේ සඳහා පිටකොටුව පන්සලේ අත්තරගම ස්වාමීන් වහන්සේ (පිටුකොටුව පොඩි හාමුදුරුවෝ), බැස්ටියන් මාවතේ වෙළඳ සංගමය, බැස්ටියන් මාවතේ ත්‍රිරෝද රථ සංගමය, මැනිං මාර්කට් වෙළඳ සංගමය, කොටුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සහ පිටකොටුව පොලීසියේ සහයෝගය ලැබිණි. මේ සඳහා මාධ්‍ය ආවරණය හා ප්‍රචාරණය මැක්ස් ටෙලිවිෂන් ආයතනය විසින් සිදු කරන ලදි. මෙම කැට ව්‍යාපාරයෙන් රු. 128,256.50 ක මුදලක් ආධාර ලෙස ලබා ගැනීමට හැකිවිය.

මෙහි ඊළඟ වැඩසටහන 2009.06.18 දින නුගේගොඩ නගරයේ දී පවත්වන ලදි. මේ සඳහා දෙහිවල-ගල්කිස්ස නගර සභාව, නුගේගොඩ ඇහලුම් වෙළඳ සංගමය සහ මිරිහාන පොලීසියේ සහයෝගය ලැබිණි. රු. 100,387.00 ක මුදලක් ආධාර ලෙස ලබා ගැනීමට හැකිවිය. මෙම කර්තව්‍යය සඳහා දානපතියන්ගෙන් ලැබුණු ආධාර මෙසේය.

| ආධාර ලබා දුන් ආයතනය | ලබා දුන් ආධාර |
|---|---|
| පශු සම්පත් මණ්ඩල කාර්ය මණ්ඩලය | ඖෂධ |
| වරාය අධිකාරියේ සභාපති ගේ සම්බන්ධීකරණයෙන් පැපුවා නිව්ගිනියා O.B.E. සංවිධානය | ඖෂධ |
| විශ්ව කාන්තා සංවිධානය | වියළි ආහාර, කිරිපිටි, ඖෂධ |
| ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය | වියළි ආහාර, ළදරු නිෂ්පාදන |
| කොළඹ දකුණ ජාත්‍යන්තර පාසල | වතුර බෝතල්, වියළි ආහාර |
| මයින්ඩ් සොලූෂන් රාජ්‍ය නොවන සංවිධානය | ළදරු නිෂ්පාදන |

2009.07.23 දින අධිකාරියේ නියෝජ්‍ය සභාපතිතුමියගේ ප්‍රධානත්වයෙන් යුතු නිලධාරී කණ්ඩායමක් පුල්මුඩේ ප්‍රදේශයේ පිහිටි අවතැන් කඳවුරු 02 ක ළමුන් සඳහා ද්‍රව්‍යමය භාණ්ඩ බෙදා හැරීම සිදු කරන ලදි.

එක්රැස් කරන ලද ඖෂධ වර්ගයන් වව්නියාවේ පිහිටි සහන ගම්මානයන්හි කලාප අංක 02 හි අධිකාරිය විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ ළමා වෛද්‍ය සායනයන්හි දී භාවිතයට ගන්නා ලදි.

## 3. උතුරු වසන්තය වැඩසටහන

මෙම ජාතික වැඩසටහන සඳහා ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම සඳහා මූලික ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් වෙන් වී නොතිබුණු බැවින් අධිකාරිය විසින් වව්නියාව සහන ගම්මානයන්හි ළමුන් හට අවශ්‍ය සේවා සැපයීම් යුනිසෙෆ් ප්‍රතිපාදන මගින් සිදු කරන ලදි.

| වැඩසටහන | භෞතික | මූල්‍ය (රු. මිලියන) | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| ළමුන්, දෙමාපියන් සහ භාරකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | වැඩසටහන් 05 | 0.1 | 300 |
| වයස්ගත රෝගවලින් වැළකීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් | වැඩසටහන් 05 | 0.1 | 500 |
| වෛද්‍යාධාර සැපයීම | ළමා සායන දිනපතා මාස 02 | 1.0 | ළමුන් 6200 |
| මනෝ සමාජයීය පහසුකම් සැපයීම | වැඩසටහන් 10 | 0.2 | ළමුන් 1200 |
| ළමුන් පිළිබඳ දත්ත එකතු කිරීම | - | 0.3 | ළමුන් 6500 |

**මූලාශ්‍රය : සැලසුම්/තොරතුරු හා මාධ්‍ය අංශය**

මෙම සියලු පහසුකම් වව්නියාවේ රාමනාදන් ගම්මානයේ ළමයින් හට 2009-06-01 දින සිට 2009-07-15 දක්වා කාලය තුළ අධිකාරියේ නිලධාරීන් සහ වෛද්‍ය කණ්ඩායම් 06 ක ගේ සහභාගිත්වයෙන් ලබා දෙන ලදි. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරියේ සුනාමි අරමුදල යටතේ රුපියල් මිලියන 2.0 ක් සහ යුනිසෙෆ් අරමුදල් යටතේ රුපියල් මිලියන 0.7 ක් මෙම වැඩසටහන සඳහා වියදම් කරන ලදි.

උතුරු වසන්තයට අදාළව යුනිසෙෆ් ප්‍රතිපාදන යටතේ දියත් කළ අනෙක් ප්‍රධානතම වැඩසටහන වූයේ ළමා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වව්නියාවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවීමයි. 2009.11.12 දින වව්නියාවේ දිස්ත්‍රික් ලේකම් ජී.එන්.එම්. චාර්ල්ස් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ ළමා සංවර්ධන කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ ගරු ලේකම් එම්. සුමනදාස මහතාගේ සහභාගිත්වයෙන් මෙම නව මධ්‍යස්ථානය විවෘත කිරීම සිදු විය. මෙම වැඩසටහන සඳහා රු. මිලියන 1.4 ක් මුදලක් යුනිසෙෆ් ප්‍රතිපාදන යටතේ වැය විය.

වව්නියා දිස්ත්‍රික් නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් සෙට්ටිකුලම් හි පිහිටි සහන ගම්මානයන්හි ළමා අරක්ෂාව සම්බන්ධව වැඩසටහන් දියත් කරන ලදි. සහන ගම්මාන කලාප අංක 0 (බින්දුවෙහි) මනෝ සමාජයීය ක්‍රියාකාරකම් සඳහා ළමා හිතකාමී (Child Friendly Space) ඒකකයක් ද, කලාප අංක 01 සහ 03 ළමා කේන්ද්‍රීය (Child Focus) ඒකක 02 ක් ද ක්‍රියාත්මක කරන ලදි.

වව්නියාව සහන ගම්මාන කලාප අංක 01 හි අරුණාචලම් සහන ගම්මානයේ Terre des homes (TDH) යන ස්වේඡ්ඡා රාජ්‍ය නොවන සංවිධානය සමග ඒකාබද්ධව Child Friendly Space වැඩසටහන දියත් කරන ලදි. මෙහිදී මූල්‍ය කළමනාකරණය TDH සංවිධානය විසින් ද, සංකල්ප කළමනාකරණය අධිකාරිය විසින් ද සිදු කරන ලදි. Child Friendly Space ඒකක 10 ක් සහන ගම්මානයෙහි පිහිටුවා මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම සිදු විය.

යුධමය තත්වයන් හේතුවෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරීම ආරම්භ කිරීමත් සමගම අධිකාරියේ සේවාවන් එම ප්‍රදේශවලට ලබා දීම සඳහා යුනිසෙෆ් ආයතනය සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන සමග සාකච්ඡා ආරම්භ කල අතර 2010 වසරේ සිට ක්‍රියාත්මකයන් සිදු කිරීමට නියමිතය.

## 4. සන්නද්ධ අරගල සඳහා යොදාගත් ළමුන් නැවත සමාජගත කිරීම

රජය භාරයට පත් වී ඇති ළමා සොල්දාදුවන් පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා 2007 වසර අග භාගයේ සිට මේ දක්වාම අධිකාරිය සක්‍රිය දායකත්වයක් සපයා ඇත. විශේෂයෙන් මෙකී පුනරුත්ථාපන කටයුතු භාරව ක්‍රියාකරන කොමසාරිස්වරයා වන අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අනෙකුත් නිලධාරීන් සමග සාකච්ඡා පවත්වමින් මෙකී වැඩසටහන ශක්තිමත් කිරීමට දායක වී ඇත. 2008 වසර අග දී පත් කරන ලද විද්වත් කමිටුව විසින් සන්නද්ධ අරගල සඳහා යොදා ගන්නා ළමයින්ගේ සුරක්ෂිතභාවය සඳහා Proposed Policy Framework on Protective Care, Rehabilitation and Reintegration of Child Combatants යන ප්‍රතිපත්ති යෝජනාවලිය ක්‍රියාවට නැංවීම පිණිස රජයට ඉදිරිපත් කරන ලදි.

## 5. දත්ත පද්ධතිය

මෙම වසරේ දී අධිකාරියේ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම සහ ක්‍රමානුකූලව යාවත්කාලීන කිරීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදි. ඒ අනුව පහත දක්වා ඇති දත්ත පද්ධති අධිකාරිය තුළ ක්‍රියාත්මක වේ.

1. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන ළමා අපයෝජන දත්ත පද්ධතිය
2. ජාතික පොලිස් ළමා අපයෝජන දත්ත පද්ධතිය (අදාළ දත්ත සඳහා තොරතුරු ලබා ගැනීම සිදු කෙරිණි.)
3. සුනාමි වින්දිත ළමුන්ගේ දත්ත පද්ධතිය

ඉහත දත්ත පද්ධතිවලට අමතරව Medico Legal Examiation Form (MLEF) සම්බන්ධව දත්ත පද්ධතියක් ආරම්භ කිරීමට කටයුතු කළ ද එහි කටයුතු පවතින්නේ මූලික අදියරේය. මෙහිදී දත්ත ගබඩාව ස්ථාපිත කිරීම, තිබෙන ආකෘති පත්‍රය ඇගයීම සහ සංශෝධන ඉදිරිපත් කිරීම සිදු කළ යුතුව ඇත. මේ වන විට පොලීසිය සහ අධිකරණ පැමිණිලි තහවුරු කිරීමේ ක්‍රමවේදයක් ලෙස මෙම ආකෘති පත්‍රය ක්‍රියාත්මක වේ.

සුනාමි ව්‍යසනය හේතු කොට වින්දිතයන් බවට පත් වූ දරුවන් සම්බන්ධව 2005 වසරේ දී කරන ලද සංගණනයක් අධිකාරිය සතු වේ. මෙම සංගණනයට ඇතුලත් වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව නිවැරදිදැයි සොයා බැලීම සඳහා මෙම වසරේ දී කරන ලද සංගණනයෙහි දත්ත පහත වගුව මගින් දක්වා ඇත.

| **මාසය** | **දිස්ත්‍රික්කය** | **ප්‍රදේශීය ලේකම් කාර්යාලය** | **වර්ගය** | **ප්‍රතිලාභීන් 2005 සංගණනයට අනුව** | **ප්‍රතිලාභීන් 2009 සංගණනයට අනුව** | **කැපකරු මාපිය නියෝග** | **වෙනත් නෛතික කටයුතු** |
|---|---|---|---|---|---|---|---|
| ජූනි | කොළඹ | සියලු | දෙමාපියන් දෙදෙනාම අහිමි | 12 | 10 | 10 | 01 |
| | කලුතර | කලුතර<br>පානදුර<br>වාද්දුව | දෙමාපියන් දෙදෙනාම අහිමි | 11 | 13 | 13 | 04 |
| ජූලි | ගම්පහ | සියලු | දෙමාපියන් දෙදෙනාම හා එක් අයෙකු අහිමි | 48 | 25 | 03 | 00 |
| | ගාල්ල | අම්බලන්ගොඩ<br>බලපිටිය<br>හික්කඩුව<br>කඩවත් සතර<br>හබරාදූව | දෙමාපියන් දෙදෙනාම හා එක් අයෙකු අහිමි | 688 | 386 | 54 | 44 |
| අගෝස්තු | හම්බන්තොට | හම්බන්තොට<br>තිස්සමහාරාම<br>තංගල්ල<br>අම්බලන්තොට | දෙමාපියන් දෙදෙනාම හා එක් අයෙකු අහිමි, අන්තඋ | 1219 | 662 | 107 | 44 |
| සැප්තැම්බර් | මාතර | මාතර<br>වැලිගම<br>දෙවිනුවර<br>දික්වැල්ල | දෙමාපියන් දෙදෙනාම හා එක් අයෙකු අහිමි, අන්තඋ | 390 | 236 | 30 | 11 |
| | | | **එකතුව** | **2368** | **1332** | **217** | **104** |

* සුනාමියෙන් පසුව කල් ඉක්ම යත්, අවුරුදු 21 වැඩි ප්‍රතිලාභීන් මෙම දත්ත පාදකයෙන් ඉවත් වේ.

## නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මූලික වශයෙන් විශ්වාසය තබන්නේ නීතිය ශක්තිමත් කිරීම මගින් සහ අපයෝජකයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම මගින් ළමා ආරක්ෂාවට අදාළව අභිමතාර්ථයන් සපුරා ගැනීම පිළිබඳවයි.

මේ සඳහා අධිකාරියේ නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් ඒකකයක් ස්ථාපිත කර ඇති අතර මෙම ඒකකය මගින් අධිකාරිය වෙත වාර්තා වන ළමා අපයෝජන පැමිණිලි දිවයිනේ පොලිස් ස්ථානවලට හා අනෙකුත් ආයතන වෙත යොමු කොට විමර්ශනය කරනු ලබන අතර එකී කාර්යය සඳහා අධිකාරියේ පොලිස් ඒකකය වෙත ද පැමිණිලි යොමු කරනු ලැබේ.

අධිකාරියට ලැබෙන්නා වූ පැමිණිලි පිලිබඳව ලේඛනගත තොරතුරු පවත්වා ගෙන යාම වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය යටතේ මධ්‍යම ලේඛනගාරයක් ස්ථාපිත කිරීම මෙම වසරේ දී සිදු විය. ඒ සමග වඩාත් විධිමත් ලෙස දත්ත, පරිගණකගත කිරීම ද මෙම වසරේ සිට ආරම්භ විය. නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරිගේ පූර්ණ අධීක්ෂණය මත මෙම ඒකකයේ රාජකාරි කටයුතු සිදු වේ.

නව පැමිණිලි ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය අනුව මූලිකවම පැමිණිලි ප්‍රධාන වර්ගීකරණයන් 05 ක් යටතේ ලියාපදිංචි කිරීම සිදු කරන ලදි.

| පැමිණිලි වර්ගය | ලියාපදිංචි කිරීමේ වර්ගීකරණය |
|---|---|
| දණ්ඩ නීති සංග්‍රහයේ ඇති ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන අපරාධ | CA 01 |
| බාල වයස්කාර ළමුන් මෙහෙකාර සේවයේ යොදවා ගැනීම | CA 02 |
| ළමුන්ගේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග | CA 03 |
| ළමයින්ගේ අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝගවල කවර හෝ විධිවිධානයක් | CA 04 |
| ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැනි ඉහත වර්ගීකරණයන්ට ඇතුළත් නොවන දෑ | CA 05 |

**මූලාශ්‍රය : නීති අංශය**

**2009 වසරේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තා වූ පැමිණිලි මෙසේය.**

| අපයෝජන වර්ගය | අධිකාරියට ලැබුණු පැමිණිලි ගණන |
|---|---|
| CA 01 | 702 |
| CA 02 | 72 |
| CA 03 | 108 |
| CA 04 | 79 |
| CA 05 | 342 |
| එකතුව | **1303** |

මූලාශ්‍රය : මධ්‍යම ලේඛනාගාරය

**2009 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වූ ඒ ඒ පැමිණිලි වර්ග, මුළු පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස**



**ඉහත වාර්තා වූ පැමිණිලිවලට අදාළ අපයෝජනයන් මෙසේය.**

| **අපයෝජන වර්ග** | **අපයෝජන සංඛ්‍යාව** |
|---|---|
| අපහරණය | 05 |
| ළමා ගබ්සා කිරීම | 01 |
| ළමයින් සිගමනෙහි යෙදවීම | 15 |
| භාරය හා ආරක්ෂාව | 166 |
| ළමා මෙහෙකාර සේවය | 79 |
| ළමුන් විවාහ කර දීම | 07 |
| අනිවාර්යය අධ්‍යාපනය | 103 |
| කායික දණ්ඩනය | 05 |
| කෲරත්වය | 332 |
| ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 40 |
| බරපතල ලිංගික අපයෝජන | 120 |
| තැනැත්තන් අතර දැඩි අශිෂ්ඨ ක්‍රියා | 26 |
| නීත්‍යානුකූලත්වයෙන් තොරව | |
| දරුවකු හදාවඩා ගැනීම | 02 |
| ව්‍යභිචාර - ස්ත්‍රී දූෂණයක් නොවන | 18 |
| ව්‍යභිචාර - ස්ත්‍රී දූෂණයක් වන | 20 |
| පැහැරගෙන යාම | 54 |
| ළමා ඝාතනය | 13 |
| ළමුන්ට අදාළව කරනු ලබන අසභ්‍ය දර්ශන | 12 |
| කුට්ටනය | 20 |
| ස්ත්‍රී දූෂණය | 94 |
| තහනම් භාණ්ඩ අලෙවියට ළමුන් | |
| යොදා ගැනීම | 04 |
| ලිංගික හිරිහැර | 30 |
| ලිංගික සූරාකෑම | 08 |
| ලිංගික ක්‍රියා සඳහා දරුවන් පෙළඹවීම | 02 |
| තැනැත්තන් වෙළඳාම් කිරීම | 45 |
| සුනාමි ව්‍යසනය | 02 |
| අස්වාභාවික ලිංගික ක්‍රියා | 06 |
| වෙනත් | 162 |
| **එකතුව** | **1391** |

**මූලාශ්‍රය : මධ්‍යම ලේඛනාගාරය**

දිස්ත්‍රික් වශයෙන් පැමිණිලි වාර්තා වීම පහත ආකාරයට සිදු වී තිබුණි.

| දිස්ත්‍රික්කය | අපයෝජන සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | 27 |
| අනුරාධපුරය | 52 |
| කළුතර | 91 |
| කෑගල්ල | 52 |
| කුරුණෑගල | 101 |
| කොළඹ | 327 |
| ගාල්ල | 91 |
| ගම්පහ | 202 |
| ත්‍රිකුණාමලය | 07 |
| පොළොන්නරුව | 53 |
| පුත්තලම | 41 |
| බදුල්ල | 44 |
| මඩකලපුව | 08 |
| මන්නාරම | 03 |
| මාතලේ | 24 |
| මාතර | 47 |
| මොණරාගල | 26 |
| මුලතිව් | 02 |
| මහනුවර | 54 |
| නුවරඑළිය | 31 |
| හම්බන්තොට | 36 |
| රත්නපුරය | 68 |
| වව්නියාව | 02 |
| යාපනය | 02 |
| **එකතුව** | **1391** |

**මූලාශ්‍රය : මධ්‍යම ලේඛනාගාරය**

## 2009 වසරේ දී දිස්ත්‍රික වශයෙන් ළමා අපයෝජන පැමිණිලි වාර්තා වීම - ප්‍රස්ථාරය ඇසුරින්



## විශේෂ පොලිස් විමර්ශන ඒකකය

අධිකාරියට ලැබෙන ළමා අපයෝජන පැමිණිලිවල ක්‍රමික වර්ධනයත්, ළමා අපයෝජන සම්බන්ධව ස්වාධීනව පරීක්ෂණ පැවැත්වීමේ අවශ්‍යතාවයත් සහ විමර්ශන කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහාත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ පොලිස් විමර්ශන ඒකකයක් 2002 වර්ෂයේදී ස්ථාපිත කරන ලදි.

ළමා හිතකාමී පරිසරයක් පොලිස් ඒකකය තුළ ඇති කිරීම සඳහා සිවිල් ඇඳුමින් සැරසී සේවයේ නියුතු ස්ථානාධිපති ඇතුලුව පොලිස් නිලධාරීන් 22 ක් (කාන්තා 09, පිරිමි 13) මෙම ඒකයේ සේවය කරනු ලබයි. ළමා ආරක්ෂාව පිළිබඳව මනා පුහුණුවකින් හෙබි මෙම නිලධාරීන් විමර්ශන මෙහෙයවීමේ දී හා වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ දී මැනවින් හා කාර්යක්ෂමව සිදු කිරීම අධිකාරිය මෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව ද ලද ජයග්‍රහණයකි.

2009 වර්ෂයේ දී පොලිස් විමර්ශන ඒකකයට පැමිණිලි 251 ක් වාර්තා විය. ඒ පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| වරද | | ලැබුණු පැමිණිලි/ තොරතුරු සංඛ්‍යාව | විමර්ශන අවසන් ගණන | | | විමර්ශන අවසන් නොවූ S | බැහැර ස්ථානවලට යොමු කළ T |
|---|---|---|---|---|---|---|---|
| | | | අධිකරණයට වාර්තා කළ P | සමථයට පත් කළ Q | අසත්‍ය R | | |
| A | ආරක්ෂාව හා භාරකාරත්වය | 32 | 16 | 08 | 04 | 01 | 03 |
| B | ලිංගික අපයෝජනය | 46 | 24 | - | 07 | 07 | 08 |
| C | කුට්ටනය | 26 | 10 | - | 05 | 06 | 05 |
| D | තදබල අශෝභන ක්‍රියා | - | - | - | - | - | - |
| E | කෲරත්වය | 14 | 06 | - | 01 | - | 02 |
| F | ස්ත්‍රී දූෂණය | 09 | 06 | - | 01 | - | 02 |
| G | ළමා මෙහෙකාර සේවය | 10 | - | - | 01 | 01 | 08 |
| H | අස්වාභාවික ක්‍රියා | - | - | - | - | - | - |
| I | පැහැරගෙන යාම | 14 | - | - | 06 | - | 08 |
| J | විවිධ වැරදි | 65 | - | 13 | 16 | 19 | 17 |
| K | ලිංගික අතවර | 14 | 02 | - | 05 | 05 | 02 |
| L | පහර දී තුවාල සිදු කිරීම | 14 | - | - | 04 | 04 | 06 |
| M | අසභ්‍ය ප්‍රකාශන ප්‍රදර්ශනය හා ළඟ තබා ගැනීම | 01 | 01 | - | - | - | - |
| N | භාරකාරත්වයෙන් අපහරණය කිරීමට තැත් කිරීම | 06 | 04 | - | - | 02 | - |
| **එකතුව** | | **251** | **69** | **21** | **51** | **47** | **63** |

**මූලාශ්‍රය : විශේෂ පොලිස් විමර්ශන ඒකකය**

## 2009 වසරේ දී පොලිස් විමර්ශන ඒකකයට වාර්තා වූ පැමිණිලි වර්ග ප්‍රමාණය - ප්‍රස්ථාරය ඇසුරින්



**පැමිණිලි/තොරතුරු පිළිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ග මුළු පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස**

**2009 වසරේ වාර්තා වූ මුළු පැමිණිලි / තොරතුරු ගණන = 251**




## වැඩසටහන් අංශය

අධිකාරියේ වැඩසටහන් සංවිධානය කිරීම හා වැඩමුළු පැවැත්වීම් වැඩසටහන් අංශය මගින් සිදු කෙරේ. සංවර්ධන වැඩසටහන් හා ක්‍රියාකාරී සැලැස්මේ ඇති කාර්යභාරයෙන් වැඩි වැඩ ප්‍රමාණයක් ඉටු කරනු ලබන්නේ වැඩසටහන් අංශය මගිනි. අධිකාරිය විසින් සැලසුම් කරනු ලබන බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන්නේ වැඩසටහන් අංශයෙනි. ඒ අනුව බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා දැනුවත් කිරීමේ වැඩසටහන්, සාකච්ඡා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම වැඩසටහන් අංශය මගින් සිදු කරනු ලබයි.

දිස්ත්‍රික් නිලධාරීන් සම්බන්ධීකරණය හා දිස්ත්‍රික් නිලධාරීන් සඳහා වැඩසටහන් පැවැත්වීම ද රාජ්‍ය නොවන සංවිධාන හා අධිකාරිය අතර සම්බන්ධීකරණය ද වැඩසටහන් අංශය මගින් සිදු කරනු ලබන රාජකාරී අතර වේ.

**වෘත්තිකයන්ගේ කුසලතා වර්ධනය**

ළමුන් සමග වැඩ කරන සහ ළමුන් සඳහා සේවය ලබා දෙන්නා වූ වෘත්තිකයන් වෙනුවෙන් ළමා හිතකාමී සේවයක් පිණිස අවශ්‍ය පුද්ගල කුසලතා වර්ධනය කිරීම මෙහි අරමුණ වේ. මේ යටතේ පහත වැඩසටහන් සිදු කරනු ලැබීය.

**පශ්චාත් උපාධි අපේක්ෂක විශේෂඥ වෛද්‍යවරු හා වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීම**

පශ්චාත් උපාධි පුහුණුව සඳහා ලියාපදිංචි වූ විශේෂඥ වෛද්‍යවරුන් හා වෛද්‍ය නිලධාරීන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය, ළමා අපයෝජන පිළිබඳ නීති හා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීම අධිකාරිය විසින් සිදු කරනු ලබයි. මේ සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

| දිනය | වැඩසටහන | ස්ථානය | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| 2009.04.30 | පුත්තලම අධිකරණ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 13 |
| 2009.08.28 | පශ්චාත් වෛද්‍ය විද්‍යා ආයතනයේ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 28 |
| 2009.10.30 | පශ්චාත් වෛද්‍ය විද්‍යා ආයතනයේ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 24 |

**මූලාශ්‍රය : වැඩසටහන් අංශය**

**<u>පවුල් සෞඛ්‍ය සේවිකාවන් හා හෙදියන් දැනුවත් කිරීමේ වැඩසටහන</u>**

මෙම වසරේ දි හෙද නිලධාරීන්ගේ කුසලතා සංවර්ධන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අධිකාරිය විසින් දියත් කරන ලදි.

| දිනය | ස්ථානය | ප්‍රතිලාභීන් |
|---|---|---|
| 2009.07.07 | මුල්ලේරියාව හෙද විදුහල | 125 |
| 2009.08.19 | මුල්ලේරියාව හෙද විදුහල | 25 |
| 2009.10.07 | මුල්ලේරියාව හෙද විදුහල | 125 |
| 2009.10.14 | කඳාන හෙද විදුහල | 250 |
| 2009.11.07 | මුල්ලේරියාව හෙද විදුහල | 125 |

## පාසල් ළමුන් දැනුවත් කිරීම

| දිනය | මාතෘකාව | ස්ථානය | ප්‍රතිලාභීන් | අංශය |
|---|---|---|---|---|
| 2009.01.09 | ළමා අයිතිවාසිකම් හා ළමා අපයෝජන | බණ්ඩාරගම විද්‍යාලය | ළමයින් 500 | මනෝ සමාජයීය |
| 2009.04.07 | ළමා අයිතිවාසිකම් හා ළමා අපයෝජන | ශාන්ත අන්තෝනි බාලිකා විදුහල, දෙමටගොඩ | ළමයින් 80 | වැඩසටහන් / මනෝ සමාජයීය |
| 2009.04.29 | ළමා අයිතිවාසිකම් හා ළමා අපයෝජන | ශාන්ත මරියා විදුහල, වාද්දුව | ළමයින් 80 | වැඩසටහන් / මනෝ සමාජයීය |
| 2009.06.19 | ළමා අයිතිවාසිකම් හා ළමා අපයෝජන | කේන්බ්‍රිජ් විද්‍යාලය, නුවරඑළිය | ළමයින් 500 | මනෝ සමාජයීය |
| 2009.12.02 | ළමා අයිතිවාසිකම් හා ළමා අපයෝජන | බෙන්තොට ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය | ළමයින් 350 | මනෝ සමාජයීය |
| 2009.10.02 | මනෝ චිකිත්සක මනෝ වැඩසටහන | රත්මලාන ශ්‍රවණාබාධිත හා දෘශ්‍යාබාධිත විද්‍යාලය | 200 | සමාජයීය |

**මූලාශ්‍රය : වැඩසටහන් සහ මනෝ සමාජයීය අංශය**

නැගෙනහිර නවෝදය වැඩටහන යටතේ අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, පුත්තලම, අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි ගැබිනි මව්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් අධිකාරිය විසින් දියත් කරන ලදි. ඒ අනුව මාතෘ සායන වැඩසටහන් 22 ක් නිම කර ඇති අතර එයින් දැනුවත් කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 700 කි. මේ සඳහා රු. මිලියන 0.3 ක මුදලක් වියදම් කොට ඇත.

## සුනාමි ව්‍යසනය හේතුකොට වින්දිත දරුවන් නැවත සමාජගත කිරීම සඳහා පහසුකම් සැපයීම

2005 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත යටතේ සුනාමි ඛේදවාචකය හේතුකොට ගෙන මව හා පියා දෙදෙනාම අහිමි වූ නැතහොත් මව හෝ පියා අහිමි වූ නැතහොත් භාරකරුවන් අහිමි වූ වයස අවුරුදු 21 දක්වා දරුවන්ගේ භාරකාරත්වය අධිකාරියට පැවරී ඇත.

මෙම වසරේ දී අධිකරණ අමාත්‍යාංශය, ආසියානු සංවර්ධන බැංකුව හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එක්ව වින්දිත වූ දරුවන්ගේ ආරක්ෂාව සඳහා වැඩසටහනක් දියත් කිරීම සිදු විය. මෙම ව්‍යාපෘතිය යටතේ භාරකාරත්වය අධිකරණය මගින් ලබා දෙන අතර, මව, පියා දෙදෙනාම අහිමි දරුවන් සඳහා රු. 10,000/- ක මුදල් තැන්පතුවක් ද මව හෝ පියා හෝ අහිමි දරුවන් හට රු. 5,600/- ක මුදල් තැන්පතුවක් ද ලබා දී ඇත. මේ සඳහා ආසියානු බැංකුව රු. මිලියන 40 ක මූල්‍යාධාර පිරිනමා ඇත.

මේ දක්වා සිදු කර ඇති කැපකරු මාපිය ඇගයීම් මණ්ඩල තොරතුරු වගුවේ දක්වා ඇත.

| අනු අංකය | දිනය | වැඩසටහන | ස්ථානය | ප්‍රතිලාභින් |
|---|---|---|---|---|
| 01 | 2009.01.27 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | 07 |
| 02. | 2009.02.02 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 01 |
| 03 | 2009.02.16 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | 05 |
| 04 | 2009.04.21 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | 05 |
| 05 | 2009.05.26 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | - |
| 06 | 2009.06.16 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | - |
| 07 | 2009.11.06 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | මාතර 10<br>ගාල්ල 02<br>(මව පියා දෙදෙනාම අහිමි) |
| 08 | 2009.11.17 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | මාතර 10<br>ගාල්ල 02<br>(මව පියා දෙදෙනාම අහිමි) |
| 09 | 2009.12.11 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ගාල්ල | 28<br>(මව පියා දෙදෙනාම අහිමි) |
| 10 | 2009.12.14 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස කාර්යාලය, මාතර | හම්බන්තොට 94<br>(මව පියා දෙදෙනාම අහිමි) |
| 11 | 2009.12.30 | සුනාමි කැපකරු මාපිය ඇගයීම් මණ්ඩලය | පරිවාස කාර්යාලය, හම්බන්තොට | මාතර 11<br>ගාල්ල 03<br>(මව පියා දෙදෙනාම අහිමි) |

**මූලාශ්‍රය : වැඩසටහන් අංශය**

## දිරිදරු පියසස සම්පත් මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම

දෙමාපියන් විදේශගත වීම, මවපියා දෙදෙනාම රැකියාවට යාම වැනි තත්වයන් නිසාත්, දරුවන්ගේ රැකවරණය සඳහා නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට නොහැකිව අසරණභාවයට පත්වන දෙමාපියන් නිසාත් දරුවන් අපයෝජනයට ගොදුරු වීමේ ඉඩකඩ වැඩිය. මෙම තත්වය වැළැක්වීම සඳහාත් දරුවන්ගේ පෞරුෂ වර්ධනය නැංවීම සහ විනෝද පහසුකම් ආදිය භුක්ති විඳීමට දරුවන්ට අවස්ථාව ලබා දීම මෙම සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණයි.

1. කල්මුණේ ඉස්ලාමාබාද් සුනාමි නිවාස සංකීර්ණයේ මෙහි පළමු මධ්‍යස්ථානය ස්ථාපනය කරඇත.
2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කිඹුල්වානාඔය ජනපදයේ (විදේශගත මව්පියන්ගේ දරුවන් වෙනුවෙන්)
3. අනුරාධපුර දිස්ත්‍රික්කයේ විජයපුර ජනපදයේ (ගොවි ප්‍රජාවේ දරුවන් වෙනුවෙන්)
4. පුත්තලම දිස්ත්‍රික්කයේ බුද්ධි ධීවර ගම්මානයේ (ධීවර ප්‍රජාවගේ දරුවන් වෙනුවෙන්)

මෙම මධ්‍යස්ථාන සඳහා මූල්‍යාධාර ඉතාලියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන පර්සෝන් කෝමේ නෝයි (Person Come Noi) ආයතනයෙන් දරනු ලබන අතර මේ වසරේ මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම සඳහා රුපියල් මිලියන 6.4 ක් වියදම් කර ඇත.

## මනෝ සමාජීය අංශය

අධිකාරියේ මනෝ සමාජීය අංශයේ මූලික රාජකාරිය වන්නේ අපයෝජනයට පත් වී වින්දිත වූ ළමුන්ගේ මානසික තත්ත්වය යහපත් කොට නැවත සමාජගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමයි. මෙහිදී මනෝ උපදේශනය සහ මනෝ චිකිත්සක ප්‍රතිකාර සඳහා වින්දිත ළමුන් යොමු කිරීම ප්‍රධාන තැනක් ගනී. එමෙන්ම ළමා අපයෝජනය වැළැක්වීම සඳහා අවශ්‍ය දැනුවත් භාවය ප්‍රජාව වෙත ළඟා කර ලීමේදී සම්පත්දායකයින් ලෙස කටයුතු කිරීම මෙන්ම අධිකාරියට ලැබෙන්නාවූ පැමිණිලි වල මනෝ සමාජීය විමර්ශන සඳහා දිස්ත්‍රික් නිළධාරීන් මෙහෙයවීම මෙම අංශයේ කාර්ය භාරයට අයත්ය. අධිකාරියේ අනෙකුත් අංශ සමග සම්බන්ධීකරණය කොට මනෝ සමාජීය වැඩසටහන් සංවිධානය කිරීම ද අධිකාරියේ මනෝ සමාජීය අංශය විසින් සිදු කරනු ලබයි. එමෙන් ම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මෙම අංශයේ නිලධාරීන් සම්පත්දායකයන් ලෙස සහභාගි වේ.

## මනෝ සමාජීය අංශය විසින් උපදේශන සේවා ලබා දීම

ළමා අපයෝජන සහ ළමා අයිතිවාසිකම් කඩවීම හේතුකොට වින්දිත බවට පත්වන්නා වූ ළමුන්ගේ මානසික සෞඛ්‍ය නගා සිටුවීම සඳහා අවශ්‍යවන්නා වූ මනෝ උපදේශනය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝ සමාජීය අංශය විසින් සිදු කරනු ලබයි. මේ අනුව මෙම වසර සඳහා උපදේශන වාර 237 ක් පවත්වා ඇති අතර අධිකාරියෙන් පිටතට ගොස් උපදේශන සේවා වාර 04 ක් පවත්වා ඇත.

| මාසය | සේවාලාභීන් | උපදේශන වාර |
|---|---|---|
| ජනවාරි | 14 | 12 |
| පෙබරවාරි | 08 | 12 |
| මාර්තු | 24 | 19 |
| අප්‍රේල් | 17 | 19 |
| මැයි | 35 | 37 |
| ජුනි | 19 | 16 |
| ජූලි | 18 | 20 |
| අගෝස්තු | 15 | 18 |
| සැප්තැම්බර් | 42 | 30 |
| ඔක්තෝම්බර් | 20 | 19 |
| නොවැම්බර් | 21 | 18 |
| දෙසැම්බර් | 22 | 17 |
| **එකතුව** | **255** | **237** |

**මූලාශ්‍රය : මනෝ සමාජීය අංශය**

මනෝ සමාජීය අංශය විසින් මෙම වසරේ සිට අධිකාරියට ලැබෙන පැමිණිලි වලින් මනෝ සමාජීය වශයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු පැමිණිලි සම්බන්ධව ද ක්‍රියා කරනු ලබයි. ඒ අනුව මෙම වසර තුළ එම අංශය විසින් පැමිණිළි සම්බන්ධව කරනු ලැබූ කාර්යයන්හි ප්‍රගතිය පහත දැක්වේ.

| මාසය | මුළු පැමිණිලි ගණන | නීති අංශය වෙත යොමු කළ | පසු විපරම සඳහා යොමු කළ | සිද්ධි සාකච්ඡා සඳහා යොමු කළ | අධිකාරියේ දිස්ත්‍රික් සම්බන්ධිකාර නිලධාරී |
|---|---|---|---|---|---|
| ජනවාරි | 22 | - | - | 02 | 22 |
| පෙබරවාරි | 09 | 02 | - | - | 09 |
| මාර්තු | 05 | - | - | - | 05 |
| අප්‍රේල් | 09 | - | - | - | 09 |
| මැයි | 14 | - | - | - | 14 |
| ජුනි | 19 | 04 | - | - | 19 |
| ජූලි | 45 | 10 | - | - | 45 |
| අගෝස්තු | 28 | 08 | 01 | - | 28 |
| සැප්තැම්බර් | 29 | 16 | 01 | - | 29 |
| ඔක්තෝම්බර් | 28 | 12 | 02 | - | 28 |
| නොවැම්බර් | 16 | 05 | - | - | 16 |
| දෙසැම්බර් | 08 | 15 | 01 | - | 08 |

**මූලාශ්‍රය : මනෝ සමාජීය අංශය**

**සහභාගි වූ පුහුණු වැඩමුළු**

- 2009.02.17 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවති ආතති කළමණාකරන වැඩමුළුව
- 2009.02.15 - 21 දින දක්වා ශ්‍රී ලංකා රතුකුරුස සංගමය විසින් සංවිධානය කළ "අපි සුරැකෙමු" වැඩසටහන
  2009.03.24 ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවති "සැමට සිත් නුඹ" මානසික හා ප්‍රජා සෞඛ්‍ය සම්බන්ධ වැඩමුළුව
- 2009.03.27 දින ජාතික ළමා ආරක්ෂක අධිකාරයේ පැවැති "තාක්ෂණය හා ළමයා" යන වැඩමුළුව
- 2009.03.17 දින නාරාහේන්පිට රුධිර පාරවිලයනය මධ්‍යස්ථානයේ පැවති "පීඩිතයන්ගේ වේදිකාව" මානසික රෝගයන්ට ගොදුරු වූවන් පිළිබඳ වැඩමුළුව
- 2009.08.13 අධිකාරි ශ්‍රවණාගාරයේදී පැවති වීඩියෝ සාක්ෂි පටිගත කිරීමට පෙර ළමුන් සූදානම් කිරීමේ එය වඩාත් ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීම කළ හැකි ආකාරය පිළිබඳව පැවති වැඩමුළුව
- 2009.08.17 - 19 සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ගැටුම් නිරාකරණය කිරීම සම්බන්ධ වැඩමුළුව සඳහා සහභාගි වීම.

**<u>ගැබිණි මව්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන</u>**

පූර්ව ප්‍රසව අවධියේ සිට ම ළමුන්ව ආරක්ෂා කර ගැනීම හා පවුල තුළ ළමා හිතකාමී පරිසරයක් ගොඩ නැගීමටත්, ළමයින් අපයෝජනයෙන් වළක්වා ගැනීම, ඊට අදාළ නීති රීති සම්බන්ධයෙන් ගැබිණි මව්වරුන්, මව්වරුන් හා සෞඛ්‍ය නිළධාරීන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කළ ළමා ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ගැබිණි මව්වරුන් දැනුවත් කිරීමේ ඉලක්කගත වැඩසටහන් ගණන 20 ක් හා ප්‍රතිලාභීන් ප්‍රමාණය 600 ක් වුවත් රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 05ක් ද, මන්නාරම දිස්ත්‍රික්කයේ වැඩසටහන් 05ක් ද, පොළොන්නරු දිස්ත්‍රික්කයේ වැඩසටහන් 07 ක් සහ අම්පාර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 05 ක් ද වන ලෙස වැඩසටහන් 22 ක් රුපියල් මිලියන 0.20 ක වියදමකින් පවත්වා ඇති අතර ප්‍රතිලාභින් සංඛ්‍යාව 990 කි.

**<u>මනෝ චිකිත්සක වැඩසටහන්</u>**

- 2009.01.04 දින රන්මුතුගල සහතික කළ පාසල් සියලු නේවාසික ළමුන් හා කාර්ය මණ්ඩලය සඳහා නිර්මාණාත්මක මනෝ චිකිත්සනය හා පෞරුෂ වර්ධනය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදි.

- 2009.03.08 දින කොට්ටාව, පන්නිපිටිය, රුක්මල්ගම ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ (බාලිකා) නේවාසික වින්දිත ළමුන් 32 සඳහා නිර්මාණාත්මක මනෝ චිකිත්සනය හා පෞරුෂ වර්ධනය පිළිබඳ වැඩසටහන් පවත්වන ලදි.

- 2009.04.06 කොට්ටාව පන්නිපිටිය රුක්මල්ගම (බාලිකා) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලිකාවන් සහ ළමුන් 60 දෙනෙකු සඳහා නිවාසගත දරුවන් සමග හිත මිතුරු අයුරින් කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් කිරීම.

- 2009.07.24 - 25 දිනයන්හි බ්‍රිතාන්‍ය නිර්මාණාත්මක චිකිත්සකවේදී ලින්ඩා රෝස් මහත්මියගේ සහභාගිත්වයෙන් අඹේපුස්ස පුනරුත්ථාපන කඳවුරේ නේවාසික යුධ වින්දිත ළමුන් සඳහා නිර්මාණාත්මක චිකිත්සක හා පෞරුෂ වර්ධනය පිළිබඳව වැඩසටහන් කිරීම.

- 2009.07.28 - 29 දින වව්නියා සහන ගම්මානයන්හි ළමුන් සඳහා නිර්මාණාත්මක චිකිත්සනය සහ පෞරුෂ වර්ධන වැඩසටහන් පැවැත්වීම.

- 2009.07.30 - 31 දිනයන්හි රත්මුතුගල සහතික කළ බාලිකා පාසලේ නේවාසික ළමුන් (40) සඳහා නිර්මාණාත්මක චිකිත්සක සහ පෞරුෂ වර්ධන වැඩසටහන් පැවැත්විණි.

- 2009.10.02 රත්මලාන ශ්‍රවණාබාධිත හා දෘෂ්‍යාබාධිත පාසලේ ළමුන් සඳහා නිර්මාණාත්මක චිකිත්සක හා පෞරුෂ වර්ධනය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම.

**<u>දැනුවත් කිරීමේ මනෝ සමාජීය වැඩසටහන්</u>**

- 2009.01.09 දින බණ්ඩාරගම විද්‍යාලයේ 7,8,9,10,11,12 වසර ශ්‍රේණිවල සියලු සිසුන් 500ක් හා ගුරුවරු සඳහා ළමා අපයෝජන සහ ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

- 2009.03.13 දින ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පැවති වැඩමුළුවේදී ප්‍රතිලාභීන් 60 දෙනෙකු සඳහා ළමා අපයෝජන සහ ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

- 2009.04.07 දෙමටගොඩ ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ළමයි 63 දෙනෙකු සඳහා ළමා අපයෝජන හා ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම.

- 2009.04.29 වාද්දුව ශාන්ත මරියා විද්‍යාලයේ ළමයි 80ක් සඳහා ළමා අපයෝජන හා ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම.

- 2009.06.19 දින හැටන් කේම්බ්‍රිජ් විද්‍යාලයේ සිසුන් හට ළමා හිතකාමී පරිසරයක් ගොඩ නැගීම පිළිබඳව දැනුවත් කිරීම

- 2009.08.24, 25 හා 26 යන දිනවල උතුරු හා නැගෙනහිර නවෝදය දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීම.

- 2009.10.09 දින මීගමුව නිවුස්ටන් බාලිකා විද්‍යාලයේ වසර 8,9,10 ශිෂ්‍යයින් සඳහා ළමා අපයෝජනය හා ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම.

- 2009.12.02 දින බෙන්තොට ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේ 8,9,10 සිසුන් හට ළමා අපයෝජනය හා ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම.

<u>**සම්පත්දායකත්වය ලබා දීම සහ වෙනත් ක්‍රියාකාරකම්**</u>

- 2009.02.12 දින ගම්පහ ධම්මාලෝක ළමා නිවාසයේ වින්දිත ළමුන් සම්බන්ධව උපදේශනයක් ලබා දීම හා විමර්ශන කටයුතු සිදු කිරීම.

- 2009.03.27 දින CHA ආයතනය මගින් සංවිධානය කරනු ලබන මනෝ සමාජ එකමුතුව රැස්වීම සඳහා සහභාගි වීම.

- 2009.03.09 දින වින්දිත ළමයකු සම්බන්ධ විමර්ශනයක් සඳහා ගාල්ල උඟරගස්මං හන්දිය ප්‍රදේශය වෙත යාම.

- 2009.03.31 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව හදාරනු ලැබූ සිසුනගේ සීමාවාසික පුහුණු කිරීම් සඳහා සහභාගි වීම.

- 2009.04.02 දින එක් අයෙකු සඳහා සීමාවාසික පුහුණු කිරීම.

- 2009.04.10 දින වින්දිත ළමයකු සම්බන්ධ විමර්ශනයක් සඳහා රත්නපුර අධිකරණ වෛද්‍ය නිළධාරී කාර්යාලය වෙත යාම.

- 2009.04.24 සීමාවාසික පුහුණු කිරීම

- 2009.04.27 සීමාවාසික පුහුණු කිරීම

- 2009.04.28 සීමාවාසික පුහුණුව ලැබීම - කැළණි විශ්ව විද්‍යාලය

- 2009.05.04 එක් අයෙකු සඳහා සීමාවාසික පුහුණු කිරීම

- 2009.05.05 එක් අයෙකු සඳහා සීමාවාසික පුහුණු කිරීම

- 2009.05.27 එක් අයෙකු සඳහා සීමාවාසික පුහුණු කිරීම

- 2009.06.19 දින පාසල් නොයන ළමුන් පිළිබඳව තොරතුරු විමර්ශනය සඳහා රාජකීය විද්‍යාලයට යාම.

- 2009.06.03 දින යක්කල ළමා නිවාසයේ වින්දිත ළමයකු පිළිබඳ තොරතුරු විමර්ශනය සඳහා යාම.

- 2009.06.10 දින නුගේගොඩ මෙත් සෙවණ මධ්‍යස්ථානයේ සිටි තැලසීමියා රෝගයට ගොදුරු වූ ළමයකු පිළිබඳ විමර්ශනයකට යාම.

- 2009.08.26 දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයේ යොවුන් වියේ දරුවන් සමග කටයුතු කිරීමේ කුසලතා යන මාතෘකාව යටතේ පැවති ගුවන් විදුලි වැඩසටහන සඳහා සහභාගි වීම.

- 2009.09.02 දින SLBC ළමාවියේ ගැටළු නිරාකරණය සඳහා දෙමාපිය කුසලතා නැංවීම.

- 2009.09.16 දින මීගමුව නිසලදිය සෙවන ළමා නිවාසයේ විමර්ශනය සඳහා සහභාගි විය.

- 2009.09.22 කලුතර විශාකා බාලිකා ළමා නිවාසයේ විමර්ශනයක් සඳහා සහභාගි වීම.

- 2009.09.25 දරුවකු පාසලෙන් ඉවත් කිරීමකට අදාළ පැමිණිල්ලක් සම්බන්ධව කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ විමර්ශනයට සහභාගි වීම.

- 2009.11.16 දින පිළියන්දල එස්.ඕ.එස්. ළමා ගම්මානයේ විමර්ශනය සඳහා සහභාගි වීම.

- 2009.12.29 මීගමුව නිසලදිය සෙවණ ළමා නිවාසයෙන් පලා ගිය දරුවන් 5 දෙනෙකු සම්බන්ධව විමර්ශනය සිදු කිරීම.

## නීති අංශය

අධිකාරියේ නීති අංශය මගින් අධිකාරියේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, සියලු ආකාරයේ ළමා අපයෝජනයන්ට අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම සහ ළමා අපයෝජන සම්බන්ධව සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතු පිළිබඳව ප්‍රගතිය නියාමනය කිරීම හා ඊට අදාළ අධිකරණයන්හි පෙනී සිටීම සිදු කරනු ලබයි.

ළමුන්ට එරෙහිව සිදු කරනු ලබන අපයෝජන පිළිබඳ පැමිණිලි තැපැල් හා ෆැක්ස් මාර්ගයෙන් ද විද්‍යුත් තැපැල් මගින් ද දුරකථන මාර්ගයෙන් ද අධිකාරියට ලැබේ. එයින් සැලකිය යුතු ප්‍රමාණයක් නිර්නාමික තොරතුරු ලෙස ලැබීම සිදු වේ. මෙම නිර්නාමික පැමිණිලි බොහෝ විට සමාජ සංවේදී මිනිසුන් හට ඇස ගැටෙන ළමා අපයෝජන සිද්ධීන් වේ. එසේ වුවත් ඇතැම් අය විසින් අසත්‍ය තොරතුරු ද අධිකාරියට ලබා දීම සිදු වන අතර මේවා එවනු ලබන්නේ තමන්ට එරෙහි පුද්ගලයන්ට විරුද්ධව වරදකට පටලැවීමේ චේතනාවෙන් බව අධිකාරියේ මතයයි.

2009 වසරේ දී පෙබරවාරි මස අග දක්වා අධිකාරියට ලැබුණු පැමිණිලි සියල්ලම පළමුව නීති අංශය වෙත යොමු කළ අතර එම පැමිණිලි වල ස්වාභාවය අනුව විමර්ශනය හා නියාමනය කළ යුතු පැමිණිල්ලක් නම් නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය වෙත හෝ පොලිස් විමර්ශන ඒකකය වෙත යොමු කරනු ලැබීය. එමෙන්ම ළමා අයිතිවාසිකම් උල්ලංඝණය වීම් පිළිබඳ පැමිණිලි මානව හිමිකම් කොමිෂන් සභාව, කම්කරු දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය වැනි ආයතන වෙත යොමු කිරීම සිදු විය.

කෙසේ වුවත් 2009 මාර්තු මස 01 දින සිට සියලු පැමිණිලි මධ්‍යම ලේඛනාගාරය වෙත යොමු කොට ලියාපදිංචි කිරීමෙන් පසු නීති ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වෙත යොමු වී ඔහුගේ සටහන් යෙදීමෙන් පසු නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීගේ අංශය මගින් විමර්ශන හා අදාළ කටයුතු සඳහා අදාළ අංශ වෙත බෙදා හැරීම සිදු කරනු ලබයි.

### පැමිණිලි සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග

අධිකාරියට ලැබෙන පැමිණිලි අතුරෙන් පැමිණිලි 517 ක ප්‍රමාණයක් අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා නීති අංශය වෙත ලබා දී ඇත.

**<u>නඩු කටයුතු</u>**

සෑම ප්‍රදේශයකම පිහිටි අධිකරණයන්හි ළමා අපයෝජනයන්ට අදාළව නඩු කටයුතු මෙහෙයවීම නීති අංශය මගින් සිදු කරනු ලබයි. මෙහිදී සුනාමි ව්‍යසනය හේතුකොට මව හෝ පියා හෝ මව පියා යන දෙදෙනාම හෝ භාරකරු අහිමි දරුවන් ගේ ආරක්ෂාව වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා නඩු කටයුතු මෙහෙයවීම නිති අංශයේ මූලික වගකීමකි. 2009 වර්ෂයේ දී නඩු කටයුතු 217ක් සඳහා අධිකාරියේ නීති නිලධාරීන් සහභාගි වී ඇත.

| අධිකරණය | සහභාගි වූ නඩු ගණන |
|---|---|
| බම්බලපිටි | 21 |
| බලපිටිය | 43 |
| බද්දේගම | 04 |
| ගාල්ල | 86 |
| හම්බන්තොට | 20 |
| අලුත්කඩේ | 09 |
| ගල්කිස්ස | 32 |
| කොළඹ | 01 |
| ගල්ගමුව | 01 |
| | **එකතුව 217** |

**මූලාශ්‍රය : නීති අංශය**

**වීඩියෝ සාක්ෂි පටිගත කිරීම**

නීති අංශය මගින් නියාමනය කරන වැදගත් අංශයක් ලෙස වීඩියෝ සාක්ෂි පටිගත කිරීම හඳුන්වා දිය හැකිය. දැනට පවතින නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් යටතේ නඩු කටයුතුවල දී අපයෝජනයට පත්වන දරුවන්ගෙන් අවස්ථා කිහිපයක දි සිද්ධිය පිළිබඳව කරුණු විමසීමත්, නඩු විභාගවල දී නැවත නැවත ප්‍රශ්න කිරීමත් හේතුවෙන් දරුවන් නැවත නැවත අපයෝජනයන්ට ගොදුරු වන අතර එය දරුවන්ගේ පෞරුෂ වර්ධනය හා මානසික සංවර්ධනය අඩාල වීම කෙරෙහි දැඩිව බලපායි. ලිංගික අපයෝජනයට පත් වන දරුවන් මෙහිදී වඩාත් අසරණ තත්ත්වයට පත් වේ. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ලිංගික අපයෝජනයට ගොදුරු වූ දරුවන්ගේ සාක්ෂිය වීඩියෝ පටයකට පටිගත කොට අදාළ අධිකරණයේ නියෝග මත එකී අධිකරණයට ඉදිරිපත් කිරීම නීති අංශය මගින් සිදු කරනු ලබයි. මෙම වසර තුළ වීඩියෝ සාක්ෂි 23 ක් පටිගත කර ඇත.

**ළමා අපයෝජන හේතු කොට වින්දිත ළමුන්ගේ ජාන පරීක්ෂාව**

ළමා අපයෝජනයන් හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමුන් ගේ අනන්‍යතාව තහවුරු කිරීම සහ විශේෂ තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා ජාන පරීක්ෂණයන් සිදු කිරීම අධිකාරිය විසින් සිදු කරනු ලැබේ. 2009 වසරේදී ජාන පරීක්ෂණ සිද්ධීන් 10 ක් රුපියල් මිලියන 0.1 ක වියදමින් සිදු කර ඇත.

**<u>සම්පත්දායකත්වය ලබා දීම</u>**

ළමා අපයෝජන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී සම්පත් දායකත්වය ලබා දීම නීති අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව මෙම වසරේ දැනුවත් කිරීමේ වැඩසටහන්16 ක් සඳහා සම්පත්දායකත්වය සපයා ඇත. එමෙන් ම විවිධ ආයතන අතර පවතින සාකච්ඡා සඳහා ද සහභාගි වේ. එවැනි වූ සාකච්ඡා 11 ක ට තම දායකත්වය සපයා ඇත.

මෙම වසරේ ළමා හිංසනයට එරෙහි දිනය වෙනුවෙන් සංවිධානය කරන ලද උත්සවයේ දී කෘතාභිමානි සම්මානය ප්‍රදානය සංවිධානය කිරීම සඳහා නීති අංශය පූර්ණදායකත්වය ලබා දෙන ලදි.

**<u>කුල වැද්දීම සම්බන්ධ ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම.</u>**

2008 වසර ආරම්භයේ සිට ම දිගින් දිගට ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වූ දරුකමට හදාගැනීම සඳහා ළමුන් පැහැරගෙන යාම, ළමුන් මුදලට විකිණීම හා ළමුන් මුදලට ලබා ගැනීම සිද්ධීන් කිහිපයකට මුහුණු දීමට අධිකාරියේ නීති අංශයට සිදු විය. බොහෝවිට මෙබඳු දේවල් සිදු වන්නේ දරුවන් දරුකමට හදා ගැනීම පිළිබඳ නීතිමය දැනුම මදකම හේතුවෙනි.

එබැවින් මෙම තත්ත්වයෙන් සමාජය මුදවනු වස් ඒ පිළිබඳ දැනුම සමාජයට ලබා දීම සඳහාත්, ළමා අපයෝජන පිළිබඳව හා අධිකාරියේ කර්තව්‍යය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහාත් නීති අංශයේ නීතිඥ රොහාන් විජේසේන මහතා විසින් "කුලවැද්දීම, ළමුන්ගේ භාරකාරත්වය සහ ළදරු ජීවිත විනාශ කිරීම සම්බන්ධ නීතිය " යනුවෙන් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරන ලදි. එය මයින්ඩ් සොලියුෂන් ආයතනයේ පූර්ණ මූල්‍ය අනුග්‍රහය මත මුද්‍රණය කිරීමෙන් අනතුරුව 2009 ඔක්තෝම්බර් 01 වැනි දිනට යෙදී තිබුණු ජාතික ළමා දිනයේදී එළිදක්වනු ලැබීය.

# සැලසුම්/තොරතුරු හා මාධ්‍ය අංශය

ජනතාවට වඩාත් සමීප වෙමින් ජාතික ළමා ආරක්ෂාව පිළිබඳව, එහි කාර්ය භාරය පිළිබඳව හා ළමා අපයෝජන වළක්වා ගැනීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා තොරතුරු සන්නිවේදනය කිරීම, තොරතුරු හා මාධ්‍ය අංශය මගින් සිදු කරනු ලබයි. එසේම අධිකාරියට පැමිණෙන අය දැනුවත් කිරීම හා ඔවුන් සඳහා පෝස්ටර්, ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය, අත්පත්‍රිකා හා ළමා කායික දඬුවම් වැළැක්වීමේ පොත් ලබාදීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ. දුර බැහැර අය සඳහා තැපැල් මාර්ගයෙන් අදාළ තොරතුරු, පෝස්ටර් හා අත් පත්‍රිකා යවනු ලබයි. ඊට අමතරව දේශන හා වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබා දේ.

ඉහත කාර්යයන්ට අමතරව මෙම වසරේ සිට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සැලසුම් විෂය සම්බන්ධව ද මෙම අංශය මගින් කටයුතු සිදු කිරීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැවරීම් සිදු කරන ලදි. ඒ අනුව මෙතෙක් පැවති තොරතුරු හා මාධ්‍ය අංශය සැලසුම්/තොරතුරු හා මාධ්‍ය අංශය ලෙසට නම් කරන්නට යෙදිණි.

<u>මෙම ඒකකයේ කාර්ය භාරය පහත අයුරින් දැක්විය හැක.</u>

**ළමා ආරක්ෂාව, ළමා අපයෝජනය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු ලබා දීම.**

මෙම කාර්ය තැපැල්, දුරකථන, ෆැක්ස් පණිවිඩ, විද්‍යුත් තැපෑල මගින් ළමා අපයෝජන හා ළමා ආරක්ෂාව පිළිබඳව දැනුම අවශ්‍ය සිසුන්, මහජනතාව හා වෘත්තිකයන් විසින් තොරතුරු ඉල්ලීම් කරනු ලබන අතර ඒ අනුව ඔවුන් වෙත ආදළ තොරතුරු ලබා දීම මෙම අංශය මගින් සිදු වේ. එමෙන්ම අධිකාරියට පැමිණීම මගින් ද තොරතුරු ලබා ගන්නා පුද්ගලයන්ට පුස්තකාල පහසුකම් සැපයීම, පත්‍රිකා හා පෝස්ටර් ලබා දිම සිදු කරනු ලැබේ.

**මුද්‍රිත ජනමාධ්‍යයන් නියාමනය**

මෙම කටයුතු සඳහා දිනපතා පුවත් පත් 09 ක් ( දිවයින, ලංකාදීප, දිණමිණ, ලක්බිම, ඩේලිමිරර්, ඩේලි නිවුස්, අයිලන්ඩ්, වීරකේසරී ) සහ සති අග ඉරිදා පුවත් පත් 09 ක් (ඉරිදා දිවයින, ඉරිදා ලංකාදීප, සිළුමිණ, ලක්බිම, ටයිම්ස්, ඔබ්සවර්, අයිලන්ඩ්, වීරකේසරී, රාවය ) නිරීක්ෂණය කරනු ලැබේ. මෙම වසරේදි ළමා අපයෝජන සිද්ධි හා අනෙකුත් ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රවෘත්ති නියාමනය කරනු ලැබූ අවස්ථා 1684 කි.

**මුද්‍රිත ප්‍රකාශ බෙදා හැරීම.**

අධිකාරිය විසින් ළමා ආරක්ෂාව සඳහා නිර්මාණය කරන ලද ප්‍රකාශනයන් නොමිලේ බෙදා දීම සිදු කරනු ලබයි. ඒ අනුව පොස්ටර්, අත්පත්‍රිකා, පොත් පිංච, ස්ටිකර්, වීඩියෝ සංයුක්ත තැටි බෙදා දීම සිදු කරනු ලබයි. මෙම වසරේ දි පුද්ගලයින් 233 කු අදාළ ප්‍රකාශන 9885 ක ප්‍රමාණයක් බෙදා දී ඇත.

**විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා පණිවුඩ නිකුත් කිරීම.**

ළමා අපයෝජන සිද්ධි පිළිබඳ තොරතුරු සහ විශේෂ කාර්යයන් සම්බන්ධ පණිවුඩ හා පුවත් පත් නිවේදන නිකුත් කිරීම අධිකාරිය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව මෙම වසරේදී ප්‍රවෘත්ති නිවේදන 21 ක් මාධ්‍යයන් වෙත නිකුත් කර ඇත.

**විද්‍යුත් මාධ්‍යයන්හි වැඩසටහන්**

එයට අමතරව සිටි එෆ්. එම්., සිරස ටී.වී., ස්වාධීන රූපවාහිනී සේවය, රූපවාහිනී සහ දෙරණ විද්‍යුත් නාලිකාවන්හි සාකච්ඡාමය වැඩසටහන් වසර පුරාවට ප්‍රචාරය වීම සිදුවේ. අධිකාරියේ සභාපති සහ නීති අංශයේ නිලධාරීන් මෙම ආරාධිත විද්වතුන් ලෙස මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ අතර මෙම කටයුතු සඳහා මාධ්‍යයන්ගේ උපරිම සහයෝගය අධිකාරිය වෙත ලැබිණි.

**<u>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය</u>**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට මෙතෙක් අඩුවක්ව පැවති පුස්තකාල ඒකකයක් මෙම වසර මුලදීම ආරම්භ කරන ලදී. මෙයින් අපේක්ෂා කරන්නේ ළමා අපයෝජනය පිළිබඳ සාහිත්‍ය වර්ධනය කිරීම සඳහා එම අංශයෙන් පර්යේෂණ පවත්වන විද්වත් ප්‍රජාවටත් පර්යේෂණයෙහි යෙදෙන විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් පරිශීලනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීමත් එම ප්‍රජාවේ පර්යේෂණ සහ සොයාගැනීම් වලින් මෙම පුස්තකාලය පෝෂණය කිරීමත් ය. මෙතෙක් ඒ ඒ විශ්ව විද්‍යාල වල බුද්ධිමය ප්‍රජාව විසින් සිදුකරන ලද පර්යේෂණ වාර්තා ආදිය ඇත්නම් පුස්තකාලයට ලබාදෙන ලෙසත් පර්යේෂණයේ හිතකැමති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පුස්තකාල සහාය දිය හැකි බවත් අදාළ විශ්ව විද්‍යාලයන්හි සමාජ විද්‍යා, මනෝ විද්‍යා සහ අපරාධ විද්‍යා අංශ වෙත දන්වා යවා ඇත.

**<u>ප්‍රදර්ශන සහ ජනතා සත්කාරක සේවා සඳහා සහභාගී වීම</u>**

ළමා ආරක්ෂාව පිළිබඳ ප්‍රජාව සමඟ සෘජු සම්බන්ධතාවයක් ගොඩනැගීම පිණිස ප්‍රදර්ශන සහ ජනතා සත්කාරක සේවා සඳහා සහභාගී වීම අධිකාරිය විසින් සිදු කරනු ලබයි. මේ යටතේ දින 17 ක් පුරාවට පැවති අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශන 4 ක් සඳහා අධිකාරියේ ප්‍රදර්ශන කුටිය සහභාගී කර ඇත. මේ යටතේ ලක්ෂයකට අධික මහජනතාව දැනුවත් කිරීම සිදු කර ඇත.

**<u>ජාතික ළමා දිනය</u>**

ළමා ආරක්ෂාව පිළිබඳව ප්‍රජාව අවදි කිරීමේ ක්‍රමෝපායක් ලෙස සෑම වසරකම ඔක්තෝම්බර් 01 දින ළමා දිනය සමරනු ලබයි. මෙවර අධිකාරියේ ළමා දින තේමාව වූයේ We all Children - The future යන්නයි. ඔක්තෝම්බර් මස 02 වැනි දින රත්මලාන ශ්‍රවණාබාධිත විද්‍යාලය සහ දෘෂ්‍යාබාධිත විද්‍යාලය මුල් කොට ජාතික ළමා දින උත්සවය පවත්වන ලදි. මෙම දිනය මුල් කොට පහත දක්වා ඇති ක්‍රියාකාරකම් කරන්නට යෙදිණි.

- බ්‍රේල් ක්‍රමයට නිර්මාණය කළ ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය දෘෂ්‍යාබාධිත ළමුන් සඳහා එළි දැක්වීමක් සිදු විය.

- සණස සංවර්ධන බැංකුවේ පූර්ණ මූල්‍ය අනුග්‍රහයෙන් " දිය බෙරලියා මල් " සහ " හඳට අඳුරක් " යන ළමා ආරක්ෂාව සම්බන්ධව වාර්තාමය ටෙලි නාට්‍ය දෙකක් එළ දැක්වීම සිදු විය.

- අප අධිකාරියේ සහකාර නීතිඥ රොහාන් විජේසේකර මහතා විසින් ලේඛනය කළ කුල වැද්දීම, ළමුනගේ භාරකාරීත්වය, ළදරු ජීවිත විනාශ කිරීම සම්බන්ධ නීතිය යන පොත රාජ්‍ය නොවන සංවිධානයක් වන මයින්ඩ් සොලූෂන් ආයතනයේ පූර්ණ මූල්‍ය අනුග්‍රහය යටතේ එළි දැක්වීම සිදු විය.

- වීරෝදාර අභ්‍යාස පොත් සමාගමත් සමග එකතුව එම සමාගමේ අභ්‍යාස පොත් හි පිටුපස කවරයෙහි ළමා මිතුරු පණිවිඩ මුද්‍රණය කිරීම සිදු කරන ලදි.

- වර්ල්ඩ් විෂන් රාජ්‍ය නොවන සංවිධානයේ පූර්ණ මූල්‍ය අනුග්‍රහ යටතේ ජාතික ළමා දිනය මුල් කොට ඔක්තෝම්බර් පළමු දින ලංකාදීප පුවත්පතේ සම්පූර්ණ පිටුවක දැන්වීමක් පළ කිරීම සිදු විය.

- ළමා ආරක්ෂාව පිළිබඳව සංඥා භාෂාවෙන් නිර්මාණය කළ සංයුක්ත වීඩියෝ තැටියක් එළි දැක්වීම සිදු විය.

- ජාතික ළමා දිනයට සමගාමීව දිස්ත්‍රික් 16 ක ළමා දින තේමාව මුල් කර ගනිමින් වැඩසටහන් පවත්වන ලදි. මේ සඳහා රුපියල් මිලියන 0.6 මුදලක් වියදම් විය.

## පරිපාලන අංශය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මානව සම්පත් කළමනාකරණය, භෞතික සම්පත් සම්පාදනය සහ නඩත්තුව පරිපාලන අංශයට පැවරී ඇත.

අධිකාරියේ කාර්යාල ව්‍යුහයට අනුව මුළු සේවක සංඛ්‍යාව 94 කි. ඉන් 50 දෙනෙකු සහකාර දිස්ත්‍රික් සමායෝජක හා සහකාර දිස්ත්‍රික් මනෝ සමායෝජක ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ට අනුයුක්තව සේවය කරනු ලබයි. ප්‍රධාන කාර්යාලය තුළ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව 44 කි. ප්‍රධාන අංශ 8 කට අනුයුක්තව මෙම පිරිස සේවය කරනු ලබයි.

2009 අග වන විට ස්ථිර සේවකයින් සංඛ්‍යාව 86 කි. තාවකාලික පදනම මත එක් සේවකයකු බඳවා ගෙන තිබුණි.

2009 වර්ෂය ආරම්භයේ දී අධිකාරියේ පුරප්පාඩු තනතුරු 07 ක් පැවතුණු අතර ඉන් තනතුරු 03 ක පුරප්පාඩු වසරේ මුල් මාස දෙක ඇතුළත පිරවීමට හැකිවිය. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, මුලතිව් සහකාර දිස්ත්‍රික් සමායෝජක, කිලිනොච්චි සහකාර දිස්ත්‍රික් මනෝ සමායෝජක යන තනතුරු මෙසේ පුරවනු ලැබූ තනතුරුය. යාපනය සහකාර දිස්ත්‍රික් සමායෝජක පත්වීම ජූලි මාසයේ දී පිරවීමට හැකි විය.

අධිකාරියේ පුරප්පාඩුව තිබූ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ හිටපු ලේකම් එම්. සුමනදාස මහතා (විශ්‍රාමික) සැප්තැම්බර් මස දී අමාත්‍යාංශයේ නිර්දේශය මත ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පත් කරන ලදි.

මෙම වසරේ දී ස්ථාන මාරු වීම් 01 ක් සිදු කරන ලදි. රත්නපුර සහකාර දිස්ත්‍රික් සමායෝජක ලෙස සේවය කළ නිලධාරියා සිය තනතුරෙන් ඉවත්ව යාම මත පුරප්පාඩු වූ තනතුර බදුල්ල සහකාර දිස්ත්‍රික්ක සමායෝජක විසින් රත්නපුර දිස්ත්‍රික්කය සඳහා මාරුවක් ලබා දෙන ලෙසට කරනු ලැබූ ඉල්ලීම මත ස්ථාන මාරුවක් ලබා දී පුරප්පාඩුව පිරවීම සිදු කරන ලදි.

මෙම වසරේ දී අධිකාරියේ සේවයෙන් ඉවත්ව යාම් 08 ක් සිදු විය. එය 2008 වසරට සාපේක්ෂව ඉහළ යාමකි. අධිකාරියේ සේවයෙන් ඉවත්ව යාමට බොහෝ විට හේතු වී ඇත්තේ වැඩි වැටුප් හා පහසුකම් සහිත රැකියා සඳහා ඉවත්ව යාමයි. කෙසේ වුවත් අධිකාරියේ පුහුණු ශ්‍රමිකයින් ඉවත්ව යාම අධිකාරියට බලවත් පාඩුවකි.

### 2009 වසරේ දී පරිපාලන අංශය මගින් 2009 වසරේ දී සිදු කරනු ලැබූ විශේෂිත කාර්යයන්

**මානව සම්පත් සංවර්ධනය**

නව දැනුමෙන් හා කුසලතාවලින් පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් සිටීම අධිකාරියට සම්පතක් හෙයින් ද, එමගින් දරුවන්ට වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබා දිය හැකි හෙයින් ද මානව සම්පත් සංවර්ධනය අධිකාරිය විසින් වැදගත් කොට සලකනු ලබයි. ඒ අනුව කාර්ය මණ්ඩලයේ කුසලතා

සංවර්ධනය අරභයා අධිකාරිය මෙම වසරේදී වැඩි වැඩ කොටසක් ඉටු කරන ලදි. විවිධ පාඨමාලා යටතේ දේශිය පුහුණු වැඩමුළු සඳහා නිලධාරින් 24 දෙනෙකු යොමු කළ අතර විදේශීය පුහුණු වැඩමුළු සඳහා නිලධාරින් දෙදෙනෙකු යොමු කරන ලදි. අධිකාරියේ සහකාර නීති නිලධාරියකු ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති සාර්ක් සාමාජික රටවල පුද්ගල ජාවාරම පිළිබඳ නිති ක්‍රියාත්මක කරවන්නන් දැනුවත් කිරීමේ දින 2 ක වැඩමුළුව සඳහා යොමු කළ අතර අධිකාරියේ වැඩසටහන් නිලධාරී සාර්ක් සාමාජයීය රටවල සාමාජිකයන් හට ළමා ශ්‍රමිකත්වය පිළිබඳව ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ පැවති දින 2 ක වැඩමුළුවක් සඳහා සහභාගි කරවන ලදි.

2009 වසරේ දී අධිකාරියේ මානව සම්පත් සංවර්ධනයට අදාළව සිදු කරනු ලැබූ පුහුණු වැඩමුළු පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

| වැඩමුළුව | ස්ථානය | සහභාගි කරවනු ලැබූ සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ආතති කළමනාකරණය<br>වාහන තත්ත්ව පාලනය හා ප්‍රමිතිකරණය | ශ්‍රී ලංකා පදනම් ආයතනය<br>CETRAC | 09<br>01 |
| සේවක ඵලදායිතාව | SDFL | 05 |
| ඔටිසම් චිකිත්සා පුහුණු වැඩමුළුව | ටැඩින් ලංකා පුද්ගලික සමාගම | 02 |
| පුහුණුකරුවන් පුහුණු කිරීමේ සහභාගිත්ව ක්‍රමවේද | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 01 |
| රියදුරු තත්ත්ව කළමනාකරණය | CETRAC | 01 |

අධිකාරියේ මානව සම්පත් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 0.256 ක මුදලක වියදම් දරා ඇත.

**<u>අධිකාරියේ දිස්ත්‍රික් වලට අනුයුක්තව සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලැබූ වැඩසටහන් (සහකාර දිස්ත්‍රික් සමායෝජකයින් හා සහකාර දිස්ත්‍රික් මනෝ සමායෝජකයින්)</u>**

අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරින් 32 දෙනෙකු සඳහා "කැනේඩියන් රෙඩ් ක්‍රොස් " ආයතනය මගින් පවත්වනු ලැබූ " BE SAFE" නමැති ළමා ආරක්ෂක උපක්‍රම කියා දෙනු ලබන වැඩසටහන් පිළිබඳ පුහුණුව ලබා දී ඇත.

අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරින්ගේ සන්නිවේදනය සහ පරිගණක දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඉතාලි රාජ්‍ය නොවන සංවිධානයක් වන "පර්සෝන් කොම් නෝයි " (Persone Come Noi) නමැති රාජ්‍ය නොවන

සංවිධානයේ මූල්‍යානුග්‍රහය මත පරිගණක ක්‍රියාකාරීත්වය සහ සන්නිවේදන මෙවලම් පිළිබඳ වැඩමුළුවක් 2009.06.18 සහ 19 යන දෙදිනයන්හි ශ්‍රි ලංකා පදනම් ආයතනයේ දී පවත්වන ලදි. මෙහිදි දිස්ත්‍රික් නිලධාරීන් 27 දෙනෙකු පුහුණුව ලැබූ අතර එක් දිස්ත්‍රික්කයට එක් ලැප්ටොප් පරිගණකයක් බැගින් ලබා දීම සිදු කරන ලදි.

සහකාර දිස්ත්‍රික් මනෝසමායෝජක නිලධාරීන් 23 දෙනෙකු සඳහා ළමා මානසික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් බෙදා හදා ගැනීමේ වැඩමුළුවක් 2009.03.12 වැනි දින ශ්‍රී ලකා පදනම් ආයතනයේ දී ප්ලැන් ශ්‍රී ලංකා ආයතනයේ පූර්ණ මූල්‍ය අනුග්‍රහය මත පවත්වන ලදි. .

නැගෙනහිර නවෝදය වැඩසටහන යටතේ අධිකාරියේ නැගෙනහිර පළාත සහ ඒ ආශ්‍රිත දිස්ත්‍රික්යන්හි සේවය කරනු ලබන සහකාර දිස්ත්‍රික් මනෝ සමායෝජක නිලධාරීන් හට මාතෘ සායන ආශ්‍රිතව පවුල් සෞඛ්‍ය සේවිකාවන් හා ගැබිණි මව්වරුන් ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධව පුහුණු කිරීමේ සැසියක් නිලධාරීන් 13 දෙනෙකු සඳහා පවත්වන ලදි.

## අධිකාරියේ නව පරිශ්‍රය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පැවති ගොඩනැගිල්ලට දිගුවක් ලෙස නව ගොඩනැගිල්ලක් ඉදි කළ අතර එය 2009.03.05 දින ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍ය ගරු සුමේධා ජී. ජයසේන මැතිණියගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. මෙම නව ගොඩනැගිල්ල සඳහා රුපියල් මිලියන 40 ක මුදලක් වියදම් විය.

## අධිකාරියට අත්‍යාවශ්‍ය සේවාවන් ලබා ගැනීම

අධිකාරියට අත්‍යාවශ්‍ය සනීපාරක්ෂාක හා පිරිසිදු කිරීමේ සේවාව, ආරක්ෂක සේවාව, පරිගණක හා සන්නිවේදන උපාංග නඩත්තුව සහ ප්‍රවාහන සේවා කුලී පදනම මත ලබා ගනු ලැබීය.

## මූල්‍ය අංශය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ රාජ්‍ය මූල්‍ය සම්බන්ධ කටයුතු කිරීම හා ගණන් තැබීම පිළිබඳ වගකීම මූල්‍ය අංශය මගින් සිදු කරයි. අධිකාරියට ලැබෙන සියලු සම්පත් කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය උපරිම වන අයුරින් හැසිරවීම ද, මූල්‍ය පාලනය මෙන්ම මූල්‍ය විනය පවත්වා ගෙන යාම සඳහා දායකත්වය ලබා දීම ද මෙම අංශය මගින් ඉටු කෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති, මූල්‍ය රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධි විධාන, ජනාධිපති ලේකම් චක්‍රලේඛ, භාණ්ඩාගාරයේ චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා විටින් විට අමාත්‍යාංශය විසින් පනවන කොන්දේසි වලට යටත්ව මූල්‍ය පාලනය සිදු කරනු ලබයි.

### 2009 වසරේදී මූල්‍ය අංශය විසින් සිදු කරනු ලැබූ රාජකාරි

- අධිකාරියේ මූල්‍ය කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය
- මහා භාණ්ඩාගාරය හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතන විසින් හඳුන්වා දී ඇති කළමනාකරණය පිළිබඳ තොරතුරු අධිකාරිය වෙත ලබා දීම.
- වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම හා විගණන විමසුම් සඳහා අවශ්‍ය තොරතුරු වාර්තා ලබා දීම.
- අවශ්‍යතාවය අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කර භාණ්ඩාගාර වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම හා වාර්ෂික අයවැය පාලනය
- අවශ්‍යතාවය අනුව මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික ගිණුම් වාර්තා අධිකාරියේ කළමනාකරණයට, අධ්‍යක්ෂ මණ්ඩලයට, අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.
- මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධ පාර්ලිමේන්තු කාරක සභාව විසින් ඉල්ලුම් කරන වාර්තා ලබා දීම.
- ස්ථාවර වත්කම් තොග අත්සන් කර ගැනීම හා පාලනය සම්බන්ධ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.
- 2009 වර්ෂය තුළ අධිකාරියේ ක්‍රියාත්මක වූ අමාත්‍යාංශයේ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ගිණුම්, ඉතාලි, යුනිසෙෆ් , සුනාමි, අයි.එල්.ඕ./අයිපෙක් වැනි ව්‍යාපෘතින්හි ගිණුම් කටයුතු සිදු කිරීම.
- අධිකාරියේ අනෙකුත් අංශයන් විසින් ඉල්ලා සිටින මූල්‍ය වාර්තා ලබා දිම.

මීට අමතරව අධිකාරිය විසින් 2009 වසර තුළ ක්‍රියාත්මක කල පහත වැඩමුළු සඳහා සක්‍රීය සහභාගිත්වය ලබා දී ඇත.

- 2009 වර්ෂයේ ජනවාරි මස ළමා හිංසනයට එරෙහි දින B.M.I.C.H වැඩසටහන
- නැගෙනහිර නවෝදය වැඩසටහන්
- සෞඛ්‍ය සේවිකාවන්/ හෙදියන් දැනුවත් කිරීමේ වැඩසටහන් - මුල්ලේරියාව , කඳාන
- යුනිසෙප් ආධාර යටතේ ක්‍රියාත්මක කල IDP කඳවුරු වල දරුවන් වෙනුවෙන් මුදල්, ආහාර සහ වෙනත් අත්‍යවශ්‍ය දෑ එකතු කිරීම් හා දේදුනු පාලම වැඩසටහන්
- ත්‍රිකුණාමලය, වෙල්ගම් වෙහෙර හා මිහිඳුපුර ළමා හා යෞවන මධ්‍යස්ථාන සම්බන්ධ මූල්‍ය කටයුතු

2009 වර්ෂයේ කළමනාකරණ හා විගණන කමිටුව වෙත අධිකාරියේ පරිපාලනමය හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ගොනු කරනු ලැබූ පත්‍රිකා කමිටුව වෙත යොමු කර නිර්දේශ ලබාගැනීම හා ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම මෙම අංශය මගින් සිදුකර ඇත. තවද මූල්‍ය කාර්ය සංග්‍රහයේ කෙටුම්පත නිර්දේශ ලබාගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.

**<u>2009 වසරේ පුනරාවර්තන වියදම විශ්ලේෂණය</u>**

| විස්තරය | මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| A වැටුප් හා වේතන | 61.4% |
| B ප්‍රවාහන | 2.1% |
| C සැපයුම් හා පරිභෝජන | 5.3% |
| D නඩත්තු | 0.3% |
| E කොන්ත්‍රාත් සේවා | 14.6% |
| F වෙනත් | 2.6% |

**<u>2009 වසරේ පුනරාවර්තන වියදම් විශ්ලේෂණය - ප්‍රස්ථාරය ඇසුරින්</u>**



# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## 2009 /12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශනය

( රුපියල් වලින් )

| විස්තරය | සටහන් | 2009 | 2008 |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | | | |
| පුනරාවර්තන - මහාභාණ්ඩාගාරය | | 44,910,000.00 | 31,950,000.00 |
| - අනෙකුත් ආයතන | 1 අ | 6,677,044.46 | 8,522,483.81 |
| අනෙකුත් ආදායම් | 1 ආ | 1,775,443.16 | 1,079,214.33 |
| ජාතික ක්‍රියාකාරිත්ව සැලැස්ම -අමාත්‍යාංශය | | 2,600,000.00 | 9,915,000.00 |
| මුළු ආදායම | | 55,962,487.62 | 51,466,698.14 |
| මෙහෙයුම් වියදම් | | | |
| සේවක වැටුප් | 2 | 27,586,576.18 | 23,357,348.76 |
| ගමන් වියදම් | 3 | 950,901.35 | 542,047.04 |
| සැපයුම් හා පාරිභෝගික සේවා | 4 | 2,384,398.92 | 2,078,201.58 |
| නඩත්තු | 5 | 1,441,139.24 | 1,618,899.40 |
| ගිවිසුම්ගත සේවා | 6 | 6,539,298.15 | 3,985,561.35 |
| ක්ෂය වීම | 7 | 3,911,962.97 | 3,410,019.03 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 8 | 1,170,025.10 | 1,229,272.83 |
| ජාතික ක්‍රියාකාරිත්ව සැලැස්ම -වියදම් | 9 | 2,767,564.07 | 8,049,835.16 |
| ව්‍යාපෘති වියදම් | 10 | 6,370,952.87 | 8,713,799.21 |
| සුනාමි ආධාර ව්‍යාපෘති වියදම් | 11 | 4,508,016.94 | 4,049,536.18 |
| මුළු මෙහෙයුම් වියදම් | | 57,630,835.79 | 57,034,520.54 |
| මෙහෙයුම් කාර්ය මගින් ලද අතිරික්තය ( ඌනතාවය) | | (1,668,348.17) | (5,567,822.40) |
| මූල්‍ය වියදම | 12 | 15,704.29 | 16,239.87 |
| අතිවිශේෂ අයිතම | 13 | 550,000.00 | 740,723.19 |
| මෙහෙයුම් හා මෙහෙයුම් නොවන කාර්ය මගින් ලැබූ ශුද්ධ අතිරික්තය ( ඌනතාවය ) | 14 | (2,234,052.46) | (6,3[illegible],785.46) |

# උපලේඛන

## උපලේඛන 1

උපලේඛන

උපලේඛන 1

| දේපළ යන්ත්‍ර හා පිරියත | 2009 | 2008 |
|---|---|---|
| ඉඩම් | **7,000,000.00** | 7,000,000.00 |
| ගොඩනැගිලි | **49,391,335.94** | 44,689,604.99 |
| මෝටර් රථ | **492,029.55** | 984,657.95 |
| ගෘහ උපකරණ | **1,151,559.08** | 1,337,587.78 |
| උපකරණ | **2,465,655.21** | 2,503,086.25 |
| ව්‍යාපෘති ස්ථාවර වත්කම් | | |
| අයි.එල්.ඕ. - ධාරිතා වර්ධන ව්‍යාපෘතිය 2005 | **33,022.00** | 52,706.00 |
| අයි.එල්.ඕකුට්ටන . 2005 | **48,714.00** | 109,188.00 |
| ලෝක බැංකු ළමා හා යෞවන මධ්‍යස්ථාන | 0.00 | 94,997.79 |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය 2005 | **427,017.00** | 1,019,861.77 |
| සුනාමි ආධාර ව්‍යාපෘතිය 2005 | **905,126.77** | 1,019,861.77 |
| ඉතාලි - සම්පත් මධ්‍යස්ථාන පරිඝනක | **1,025,957.50** | 498,075.00 |
| ඉතාලි - සම්පත් මධ්‍යස්ථාන කාමිඋපකරණ | **21,854.00** | 32,781.00 |
| ඉතාලි - සම්පත් මධ්‍යස්ථාන් ගෘහ උපකරණ | **469,826.00** | 570,503.00 |
| ඉතාලි - සම්පත් මධ්‍යස්ථාන උපකරණ | **72,781.80** | 88,377.90 |
| ඉතාලි - සම්පත් මධ්‍යස්ථාන සංගීත භාණ්ඩ | **36,190.00** | 54,285.00 |
| ඉතාලි - සම්පත් මධ්‍යස්ථාන ක්‍රීඩා උපකරණ | **247,588.60** | 300,643.30 |
| උප එකතුව | 63,788,657.45 | 59,342,408.30 |

| උපලේඛන 2 | 2009 | 2008 |
|---|---|---|
| ආයෝජන හා ඉතිරි කිරීම් | | |
| පාරිතෝෂික දීමනා අරමුදල් ආයෝජන | 877,325.75 | 834,337.60 |
| ඉතිරිකිරීම් ගිණුම | 18,675,145.70 | 17,884,916.38 |
| අපදා ණය නැවත ගෙවීම් අරමුදල් ගිණුම | 619,469.56 | 413,640.45 |
| උප එකතුව | 20,171,941.01 | 19,132,894.43 |

| උපලේඛන 3 | 2009 | 2008 |
|---|---|---|
| ලැබිය යුතු ගිණුම් | | |
| යුනිසෙෆ් මනෝ සමායෝජක වැඩසටහන් | 235,379.00 | 235,379.00 |
| උත්සව අත්තිකාරම් | 70,900.00 | 26,700.00 |
| ආපදා ණය | | |
| N.D.B මල්කාන්ති | 2,666.00 | 29,570.00 |
| R. මනිසේකරන් | 15,895.99 | 33,258.00 |
| M.G.T.L යසවර්ධන | 31,650.09 | 52,750.05 |
| M.G.J වික්‍රමසිංහ | 28,732.94 | 45,972.97 |
| ලැබිය යුතු ගිණුම් -චතු ළමුන් | 0.00 | 96,112.00 |
| ලැබිය යුතු ගිණුම් -නෆ්පීලා / ඉසදීන් | 0.00 | 8,500.00 |
| මුදල් අත්තිකාරම් | 325,468.88 | 1,245,660.21 |
| මුදල් අත්තිකාරම් - ව්‍යාපෘති | 20,795.30 | 230,577.00 |
| උප එකතුව | 731,488.20 | 2,004,479.23 |

| උපලේඛන 4 | 2009 | 2008 |
|---|---|---|
| පෙර ගෙවුම් | | |
| රක්ෂණය | 228,422.65 | 179,039.00 |
| සේවා ගිවිසුම් -ඡායා පාටපත් | 14,466.67 | 5,548.75 |
| සේවා ගිවිසුම් -ෆැක්ස් යන්ත්‍රය | 3,920.00 | 64,232.29 |
| ඉන්ධන තැන්පතු | 7,500.00 | 7,500.00 |
| උප එකතුව | 254,309.32 | 256,320.04 |

| උපලේඛන 5 | 2009 | 2008 |
|---|---|---|
| මුදල් හා මුදල් වලට සමාන දෑ | | |
| ලංකා බැංකුව නුගේගොඩ - ගි.අං. 228076 | 227,232.27 | 57,985.42 |
| ලංකා බැංකුව නුගේගොඩ - ගි.අං. 4171645 | 52,892.05 | 28,494.25 |
| මහජන බැංකුව -නුගේගොඩ-ගි.අං.174-1-001-4-0347385 | 475,692.41 | 2,375,408.04 |
| ලංකා බැංකුව තැප්රොබේන් - ගි.අං.2026588 | 30,902.71 | 34,502.00 |
| සුළු මුදල් | 9,966.00 | 5,628.00 |
| උප එකතුව | 796,685.44 | 2,502,017.71 |

ජංගම ගිණුම් අංක 22807 (ලංකා බැකුව - නුගේගොඩ) විවෘත කරන ලද්දේ රජයෙන් ලැබෙන ප්‍රදාන සඳහාය. ජංගම ගිණුම් අංක 4171645 (ලංකා බැකුව - නුගේගොඩ) විවෘත කරන ලද්දේ ILO ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා වුවත් එය 2008 වසරේ ජූලි මස අවසන් විම නිසා ඉතාලි ව්‍යාපාතිය වෙනුවෙන් වර්තමානයේ භාවිතා කරයි. මහජන බැංකු නුගේගොඩ ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම අනුග්‍රාහක ආධාර වැඩසටහනේ ආධාර ලැබීම් වෙනුවෙන් පවත්වා ගෙන යන ලදි. ගිණුම් අං 202588 ලංකා බැංකු තුබ්‍රෝබේන් ශාඛාවේ විවෘත කරන ලද්දේ භාණ්ඩාගාර ගණුදෙනු සඳහාය.

| උපලේඛන 6 | 2009 | 2008 |
|---|---|---|
| ගෙවිය යුතු ගිණුම් හා වෙන්කිරීම් | | |
| විගණන ගාස්තු වෙන්කිරිම් | 30,000.00 | 30,000.00 |
| ගෙවිය යුතු සුළු මුදල් | 1,669.00 | 1,669.00 |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම් | 1,117,562.50 | 806,545.00 |
| ඉතිරිකිරීමේ ගිණුමට | 0.00 | 500,000.00 |
| උප එකතුව | 1,149,231.50 | 1,338,214.00 |

| උපලේඛන 7 | 2009 | 2008 |
|---|---|---|
| උපචිත වියදම් | | |
| අපදා ණය නැවත ගෙවීම් | 619,469.56 | 419,187.45 |
| M.H.M Riyaz වැටුප් නැවත ගෙවීම් | 360.00 | 0.00 |
